# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2346/02 - 2023 අගෝස්තු මස 21 වැනි සඳුදා - 2023.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 203/33 (VIII)

**(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 24(1) (ජ), (ට), සහ (ඩ) වගන්තිය සමග කියවිය යුතු 64(2) (ඊ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2023 අංක 01 දරන දැව, කැලෑ ගස් වර්ගවල බීජ හා වෙනත් වන නිෂ්පාදන අපනයන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තෙකු විසින්, දැව, කැලෑ ගස් වර්ගවල බීජ හෝ වෙනත් වන නිෂ්පාදන කිසිවක් තත්කාර්ය සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ මිස, අපනයනය කරනු නොලැබිය යුතුය.

3. (අ) දැව අපනයනය බලපත්‍රයක් සඳහා වන සෑම අයදුම් පත්‍රයක් ම මෙම නියෝගවල I වන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව; සහ

   (ආ) වන නිෂ්පාදන, සහ කැලෑ ගස් වර්ගවල බීජ අපනයන බලපත්‍රයක් සඳහා වන සෑම අයදුම්පත්‍රයක් ම මෙම නියෝගවල II වන උපලේඛනයට සාරානුකූලව,

   විය යුතු අතර එය වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

1A - PG 6451 — 506 (2023/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (අ) දැව අපනයනය සඳහා වන බලපත්‍රය මෙම නියෝගවල III වන උපලේඛනයට සාරානුකූලව; සහ

(ආ) වන නිෂ්පාදන සහ කැලෑ ගස් වර්ගවල බීජ වර්ග, අපනයනය සඳහා වන බලපත්‍රය මෙම නියෝගවල IV වන උපලේඛනයට සාරානුකූලව,

විය යුතු ය.

5. වන සංරක්ෂණ ජනරාල්වරයා හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් යම් සාධාරණ කාලයක දී අපනයනය සඳහා සූදානම් කර ඇති යම් දැව, කැලෑ ගස් වර්ගවල බීජ හෝ වෙනත් වන නිෂ්පාදන පරීක්ෂා කළ හැකි ය.

6. අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රයක් පරීක්ෂා කිරීම සඳහා යම් වන නිලධරයකු, ඒ සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය දෙන යම් නිලධරයකු, උප පොලිස් පරීක්ෂක නිලයට නොඅඩු යම් පොලිස් නිලධරයකු හෝ රේගු ආඥා පනත යටතේ බලයලත් යම් නිලධරයකු විසින් ඉල්ලා සිටින විට එම බලපත්‍රය ඉදිරිපත් කිරීම සහ බලපත්‍රය නිකුත් කරනු ලබන ලද අපනයනය කිරීම සඳහා වන දැව, කැලෑ ගස් වර්ගවල බීජ හෝ වෙනත් වන නිෂ්පාදන සම්බන්ධයෙන් තමා දන්නා සියලු තොරතුරු, ඒ නිලධරයා විසින් නියම කරනු ලැබූ කවර විටෙක වුවද, සැපයීම ද බලපත්‍රය දරන්නාගේ යුතුකම විය යුතුය.

7. මේ නියෝග වල -

"වන සංරක්ෂක ජනරාල්" යන්නෙන්, ආඥාපනත ප්‍රකාරව පත් කරනු ලැබූ වන සංරක්ෂක ජනරාල් වරයා අදහස් වන අතර, අතිරේක වන සංරක්ෂක ජනරාල් වරයාද ඊට ඇතුලත් වන්නේය.

"වන නිෂ්පාදන"

(අ) ගස්, පත්‍ර සහ එල, බීජ, මුල්, යුෂ, දැව, අඟුරු, මුහුන්, කයිප්පු, කාෂ්ඨ තෙල්, දුම්මල, ස්වාභාවික ඔප තෙල්, පොතු, ලාක්සා, මැලියම්, තිපල්,

(ආ) තෘණ, වැල්, බට සහ පෙඳද ඇතුලු ගස් නොවන ශාඛ පැළෑටි හා ඒවායේ සියලු කොටස් හෝ එලයන්

(ඇ) හුණුගල්, හිරිගල්, කබුක්, බිටුමන්, බිටුමන් ශල්ක, ස්වාභාවික තාර, ඛණිජ තෙල් සහ පතල්වල සහ ගල් වළවල් වලින් උපදින සියලු නිෂ්පාදන ඇතුලු පාෂාණ ගත කාබනික ද්‍රව්‍ය, මතුපිට පස, ගල් සහ ඛණිජ ද්‍රව්‍ය ඇතුලත් වන්නේය.

"ආඥාපනත" යන්නෙන්, (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥා පනත අදහස් වේ.

"කැලෑ ගස් වර්ග වල බීජ" යන්නෙන්, ආඥාපනතේ I වන උපලේඛනයේ හෝ II වන උපලේඛනයේ සඳහන් ගස් වලින් යම් ගසක් සහ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මඟින් කලින් කල නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ගසක තම ශාඛ විශේෂය ජනිත කිරීමේ හැකියාව ඇති හෝ නැති බීජ සහ එල අදහස් වන්නේය.

8. 2000 දෙසැම්බර් මස 05 වන දින අංක 1161/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2000 අංක 01 දරන කැලෑ නියෝග ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## I වන උපලේඛනය

3 (අ) නියෝගය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|
| ඉල්ලුම් පත්‍ර අංකයඃ | |
| ලැබුණු දිනයඃ | |
| නිකුත් කළ දිනයඃ | |

*දැව අපනයනය සඳහා ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය

(පුද්ගල/ සමාගම්)

2. ජාතික හැඳුනුම්පත් අංකයඃ / ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකයඃ

| | |
|---|---|
| ජා.හැ. අංකය ඃ | |
| විදේශ ගමන් බ. අංකය ඃ | |
| ව්‍යාපාර ලි.ප. අංකය ඃ | |
| දුරකථන අංකය ඃ | |

3. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැව ගබඩා ලියාපදිංචි අංකය. සහ ව්‍යාපාරයේ ස්වභාවය.

| | |
|---|---|
| වන සං. දෙපා. ලියා පදිංචි අංකයඃ | |
| ව්‍යාපාරයේ ස්වභාවයඃ | |

4. අපනයනය කරනු ලබන නිෂ්පාදනවල තොරතුරු

| අයිතමය | දැව විශේෂය | දිග (සෙ. මී) | පළල (සෙ. මී) | ඝනකම / උස (සෙ. මී) | කැබලි සංඛ්‍යාව | පරිමාව (ඝන මීටර) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

5. දැව ලබා ගත් ඉඩමේ හිමිකරුගේ නම සහ ලිපිනය.

5.1. හිමිකම් ඔප්පුවේ අංකය සහ පිඹුරේ අංකයඃ

| | |
|---|---|
| හිමිකම් ඔප්පුවේ අංකය : | |
| පිඹුරේ අංකය : | |

5.2. නිෂ්පාදනය මිලදී ගෙන ඇත්තේ ගනුදෙනුකරුවෙකුගෙන් නම්, ඔහුගේ නම සහ ලිපිනය

6. ගබඩාවේ නම සහ ලිපිනය

7. අපනයනය කරනු ලබන රට

8. ලබන්නාගේ නම සහ ලිපිනය.

9. අපනයනය කිරීමේ අරමුණ.

10. භාණ්ඩ අපනයනය කරන නැව් වාර ගණන/ බහාලුම් වල විශාලත්වය

| බහාලුම් වර්ගය | අඩි 20 | අඩි 40 | අඩි 20ට අඩු | ගුවන් බහාලුම් |
|---|---|---|---|---|
| සංඛ්‍යාව | | | | |

11. අපනයනය කිරීමට අපේක්ෂිත දිනය

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මාගේ/අපගේ දැනුම් ප්‍රමාණයට අනුව සත්‍ය සහ නිවැරදි බවට මම/ අපි සහතික වෙමි/වෙමු.

.......................................... ..............................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

*අපනයනය කරනු ලබන දැව සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ ප්‍රකාශය*

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : .......................................................................................................
අපනයනය කරනු ලබන රට : .......................................................................................................
ප්‍රවාහන බලපත්‍රයේ අංකය සහ දිනය : .......................................................................................................
(බලපත්‍රයේ මුල් පිටපත ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය)

ගෘහ භාණ්ඩ ලැයිස්තුව :

| අංකය | අයිතමය | දැව විශේෂය | මිනුම් | | | කැබලි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | දිග (සෙ.මී) | පළල (සෙ. මී) | ඝනකම / උස (සෙ.මී) | |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |
| 06 | | | | | | |
| 07 | | | | | | |
| 08 | | | | | | |
| 09 | | | | | | |
| 10 | | | | | | |
| 11 | | | | | | |
| 12 | | | | | | |
| 13 | | | | | | |
| 14 | | | | | | |
| 15 | | | | | | |
| 16 | | | | | | |
| 17 | | | | | | |
| 18 | | | | | | |
| 19 | | | | | | |
| 20 | | | | | | |
| | එකතුව | | | | | |

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මාගේ / අපගේ දැනුම් ප්‍රමාණයට අනුව සත්‍ය සහ නිවැරදි බවටත් තොරතුරු වසන් කිරීමක් හෝ ඉදිරිපත් නොකර රඳවා තබා ගැනීමක් සිදු නොකරන බවටත් මම / අපි සහතික වෙමි / වෙමු. මා / අප විසින් ඉදිරිපත් කරන ලද වැරදි හෝ අසත්‍ය තොරතුරු හේතු කොට ගෙන භාණ්ඩ තොගය අපනයනය කිරීමට නොහැකි වුවහොත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒ සඳහා කිසිදු ආකාරයකින් වගකීමක් නොදරන බවටත්, ඒ සඳහා කිසිදු ආකාරයකින් නීත්‍යානුකූල නොවන මැදිහත් වීමක් සිදු නොකරන බවටත් මා / අප දැනුවත් බව මෙයින් සහතික කර සිටිමි / සිටින්නෙමු.

..............................................................
දිනය : ...................................................    ඉල්ලුම්කරුගේ අත්සන

නම : ...................................................
ජා. හැ. අංකය : ...................................................

II වන උපලේඛනය

(3 (ආ) නියෝගය)

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|
| ඉල්ලුම් පත්‍ර අංකය: | |
| ලැබුණු දිනය: | |
| නිකුත් කළ දිනය: | |

*කැලෑ ගස්වල බීජ සහ වන නිෂ්පාදන*
*අපනයනය සඳහා ඉල්ලුම් පත්‍රය*

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය

(පුද්ගල/ සමාගම්)

2. ජාතික හැඳුනුම්පත් අංකය : /
වයාපාර ලියාපදිංචි කිරීමේ අංකය :/
විදේශ ගමන් බලපත්‍ර අංකය :

| | |
|---|---|
| ජා. හැ. අංකය : | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය : | |
| ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය : | |
| දුරකථන අංකය : | |

3. පැළ තවාන ලියාපදිංචි කිරීමේ අංකය.

4. අපනයනය කරනු ලබන නිෂ්පාදන වල තොරතුරු

| *සාමාන්‍ය නාමය* | *විද්‍යාත්මක නාමය* | *විශාලත්වය / ස්කන්ධය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| එකතුව | | | |

5. ද්‍රව්‍ය එක්රැස් කළ / මිලදී ගත් ස්ථානය

5.1. ද්‍රව්‍ය එක්රැස්කරන ලද්දේ රජයේ ඉඩමකින් නම් ද්‍රව්‍ය එක්රැස් කිරීමට ලබා දුන් බලපත්‍රයේ අංකය සහ දිනය

5.2. ද්‍රව්‍ය මිලදීගෙන ඇත්තේ ගනුදෙනුකරුවෙකුගෙන් නම් ඔහුගේ නම සහ ලිපිනය

6. ගබඩාවේ නම සහ ලිපිනය

7. අපනයනය කරනු ලබන රට

8. ලබන්නාගේ නම සහ ලිපිනය.

9. අපනයනය කිරීමේ අරමුණ.

10. ද්‍රව්‍ය අපනයනය කරන නැව් වාර ගණන/ බහාලුම්වල විශාලත්වය

| බහාලුම් වර්ගය | අඩි 20 | අඩි 40 | අඩි 20 ට අඩු | ගුවන් බහාලුම් |
|---|---|---|---|---|
| සංඛ්‍යාව | | | | |

11. අපනයනය කිරීමට අපේක්ෂිත දිනය

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මාගේ/ අපගේ දැනුම් ප්‍රමාණයට අනුව සත්‍ය සහ නිවැරදි බවට මම / අපි සහතික වෙමි/ වෙමු

.......................................... ..........................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

## කැලෑ ගස් වල බීජ සහ වන නිෂ්පාදන අපනයනය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ ප්‍රකාශය

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ........................................................................................................................
2. අපනයනය කරනු ලබන රට : ........................................................................................................................
3. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය : ..........................................................................................

4. අපනයනය කරනු ලබන ශාකවල හෝ ශාක කොටස්වල හෝ නිෂ්පාදනවල තොරතුරු

| අංකය | ශාකවල සාමාන්‍ය නාමය | විද්‍යාත්මක නාමය | මිනුම් | | කැබලි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | උස (සෙ.මී) | බර (කි.ග්‍රෑ) | |
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| 05 | | | | | |
| 06 | | | | | |
| 07 | | | | | |
| 08 | | | | | |
| 09 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |
| 13 | | | | | |
| 14 | | | | | |
| 15 | | | | | |
| 16 | | | | | |
| 17 | | | | | |
| 18 | | | | | |
| 19 | | | | | |
| 20 | | | | | |
| එකතුව | | | | | |

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු මාගේ / අපගේ දැනුම් ප්‍රමාණයට අනුව සත්‍ය සහ නිවැරදි බවටත් තොරතුරු වසන් කිරීමක් හෝ ඉදිරිපත් නොකර රඳවා තබා ගැනීමක් සිදු නොකරන බවටත්, මම / අපි සහතික වෙමි / වෙමු. මා / අප විසින් ඉදිරිපත් කරන ලද වැරදි හෝ අසත්‍ය තොරතුරු හේතුකොටගෙන මෙම ද්‍රව්‍ය අපනයනය කිරීමට නොහැකි වුවහොත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒ සඳහා කිසිදු ආකාරයකින් වගකීමක් නොදරන බවටත් ඒ සඳහා කිසිදු ආකාරයකින් මැදිහත් වීමක් සිදු නොකරන බවටත් මා / අප දැනුවත් බව මෙයින් සහතික කර සිටිමි / සිටින්නෙමු.

..............................................

දිනය : .....................................................   ඉල්ලුම්කරුගේ අත්සන

නම : ....................................................

ජා. හැ. අංකය : ....................................................

III වන උපලේඛනය

(4(අ) වන නියෝගය)

අවසර පත්‍රයේ අංකය : ................... දිනය

*දැව අපනයනය සඳහා අවසර පත්‍රය*

(ශ්‍රී ලංකාව තුල ප්‍රවාහනය සඳහා වලංගු නොවේ. අන්සතු කළ නොහැක)

කුවිතාන්සි අංකය : ...................................... දැව මත තැබූ මුද්‍රා සළකුණ
මුදල රුඃ ......................................

අපනයනය කළ යුතු දැව

| *අංකය* | *දැව විශේෂය* | *අයිතමය* | *දිග (සෙ.මී)* | *පළල (සෙ. මී)* | *උස (සෙ.මී)* | *කැබලි සංඛ්‍යාව* | *පරිමාව (ඝන මීටර්)* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | එකතුව | | | | | | |

ඉල්ලුම්කරුගේ නම : ........................................................................................................................................
ලිපිනය : ........................................................................................................................................
ජා. හැ. අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය : ........................................................................................
ද්‍රව්‍ය ලබා ගත් ඉඩමේ නම සහ පිහිටීම : ........................................................................................................
ද්‍රව්‍ය එක් රැස් කරන ලද්දේ රජයේ ඉඩමකින් නම්, අවසර පත්‍රයේ අංකය : ..........................................................................
අවසර පත්‍රය නිකුත් කල නිලධාරියාගේ නම / තනතුර ..........................................................................
මෙම භාණ්ඩ (පාවිච්චි කරන ලද/ නව) දැව ගබඩාවකින් / ගෘහ භාණ්ඩ අලෙවි සැලකින් එක්රැස් කරන ලද / මිලදී ගන්නා ලද භාණ්ඩ නම්,
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය : ..........................................................................
අපනයනය සඳහා බලයලත් ආයතනය : ..........................................................................
අපනයනය සඳහා අවසර ලැබී ඇති රට : ..........................................................................................
වන සංරක්ෂණ ආඥා පනතේ 24 (1) ("ජ") වගන්තිය යටතේ සකස් කරන ලද නියෝග වල ..................................................................
දරන නියෝගය කෙරෙහි අවධානය යොමු කරන්න
(කොන්දේසි සඳහා අනෙක් පිටුව බලන්න).

මෙම අවසර පත්‍රය ......./......../....... දින සිට ......./......../....... දින දක්වා භාණ්ඩ අපනයනය සඳහා වලංගු වේ
නිකුත් කළ දිනයඃ ......./......../....... නැව් වාර ගණනඃ (................)

.........................................................
අත්සන
වන සංරක්ෂක ජනරාල් *වෙනුවට.*

පිටපත්

1. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව. - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
2. ආනයන සහ අපනයන පාලක. - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

*කොන්දේසි*

01. අපනයනය සඳහා යම් අවසර පත්‍රයක් නිකුත් කර ඇති විටකදී, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් වන නිලධරයකු විසින් හෝ යම් රේගු නිලධරයකු විසින් හෝ එම අවසර පත්‍රය පරීක්ෂා කිරීමට සහ පිටපත් කිරීමට ඉල්ලා සිටිනවිට දී එය ඉදිරිපත් කිරීම අපනයනය සඳහා නිකුත් කරන ලද අවසරපත්‍රය හිමි අවසර පත්‍ර හිමියාගේ වගකීම වේ.

02. මෙම අවසර පත්‍රය අන්සතු කළ නොහැක.

03. ඉහත (1)වන කොන්දේසියේ සඳහන් යම් නිලධරයකු විසින් අවසර පත්‍රයට අදාල ද්‍රව්‍ය ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී එම ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම අවසරපත්‍ර හිමියාගේ වගකීම වේ.

04. යම් අවස්ථාවකදී යෝග්‍යයයි සලකා අවසරපත්‍ර නිකුත් කරන නිලධාරියා විසින් සිය අත්සන සහ නිල මුද්‍රාව යොදා සහතික කරන ලද යම් අමතර කොන්දේසි ඇත්නම්, එලෙස පනවනු ලබන කොන්දේසිද අවසර පත්‍ර හිමියා විසින් පිළිපැදිය යුතුය.

05. අපනයන කරනු ලබන්නේ දැව කඳන් හෝ ඉරන ලද දැව නම්, අවසර පත්‍රයේ සඳහන් මුද්‍රා සළකුණ දැව කඳන් මත මෙන්ම ඉරන ලද දැව කැබලි මතද තිබිය යුතුය.

වන සංරක්ෂණ ආඥා පනතේ (451 වැනි අධිකාරය වූ ) 24 (1) (ජ) වගන්තිය යටතේ සාදන ලද ඉහත සඳහන් කොන්දේසි සහ නියමයන් පිළිපැදීමට මම එකඟ වෙමි.

............................................ ..........................................................

දිනය අවසර පත්‍ර හිමියාගේ අත්සන

IV වන උපලේඛනය

(4(ආ) වන නියෝගය)

අවසර පත්‍රයේ අංකය : .................... දිනය

*කැලෑ ගස්වල බීජ සහ වන නිෂ්පාදන*
*අපනයනය සඳහා අවසර පත්‍රය*

(ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනය සඳහා වලංගු නොවේ. අන්සතු කළ නොහැක)

කුවිතාන්සි අංකය : ....................................... ද්‍රව්‍ය මත තැබූ මුද්‍රාසළකුණ
මුදල රු : .......................................

ශාක හෝ වෙනත් වන නිෂ්පාදන

| *අංකය* | *සාමාන්‍ය නාමය* | *විද්‍යාත්මක නාමය* | *විශාලත්වය/ පළල (එකතුව)* | *ප්‍රමාණය ශාක/ කොටස් සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| | | | | |
| | එකතුව | - | - | |

ඉල්ලුම්කරුගේ නම : ..........................................................................................................................................

ලිපිනය : ..........................................................................................................................................

ජා. හැ. අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය : ..........................................................................................................

ද්‍රව්‍ය ලබා ගත් ඉඩමේ නම සහ පිහිටීම : ..........................................................................................................................

ද්‍රව්‍ය එක් රැස් කරන ලද්දේ රජයේ ඉඩමකින් නම්, අවසර පත්‍රයේ අංකය : ..................................................................................

අවසර පත්‍රය නිකුත් කළ නිලධාරියාගේ නම / තනතුර : ..........................................................................................................

වන නිෂ්පාදන එක්රැස් කරන ලද්දේ / මිලදීගනු ලැබුවේ පැළ තවානකින් නම්,

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය : ..................................................................................

ආයතනය : .......................................................................................................................... ආයතනය, ශ්‍රී ලංකාවේ සිට ඉහත සඳහන් ද්‍රව්‍ය

අපනයනය කිරීමට අවසර ලැබී ඇත.

වන සංරක්ෂණ ආඥා පනතේ 24 (1) ("ජ") වගන්තිය යටතේ සකස් කරන ලද නියෝග වල ..................................................................
දරන නියෝගය කෙරෙහි අවධානය යොමු කරන්න

(කොන්දේසි සඳහා අනෙක් පිටුව බලන්න).

මෙම අවසර පත්‍රය ......./......../....... දින සිට ......./......../....... දින දක්වා භාණ්ඩ අපනයනය සඳහා වලංගු වේ.
නිකුත් කළ දිනයඃ ......./......../....... නැව් වාර ගණනඃ (................)

............................................
අත්සන
*වන සංරක්ෂක ජනරාල් වෙනුවට.*

*පිටපත්*

1. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව. - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
2. අධ්‍යක්ෂ, බීජ සහතික කිරීමේ සහ ශාක සංරක්ෂණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
3. ශාක නිරෝධායන සේවය - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
4. ආනයන සහ අපනයන පාලක - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

*කොන්දේසි*

01. අපනයනය සඳහා යම් අවසරපත්‍රයක් නිකුත් කර ඇති විටකදී වන සංරක්ෂක ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් වන නිලධරයකු විසින් හෝ යම් රේගු නිලධරයකු විසින් හෝ එම අවසරපත්‍රය පරීක්ෂා කිරීමට සහ පිටපත් කිරීමට ඉල්ලා සිටිනවිට දී එය ඉදිරිපත් කිරීම අපනයනය සඳහා නිකුත් කරන ලද අවසරපත්‍රය හිමි අවසරපත්‍ර හිමියාගේ වගකීම වේ.

02. මෙම අවසර පත්‍රය අන්සතු කල නොහැක.

03. ඉහත (1) වන කොන්දේසියේ සඳහන් යම් නිලධරයකු විසින් අවසර පත්‍රයට අදාළ ද්‍රව්‍ය ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී එම ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම අවසරපත්‍ර හිමියාගේ වගකීම වේ.

04. යම් අවස්ථාවකදී යෝග්‍යයයි සලකා අවසර පත්‍ර නිකුත් කරන නිලධාරියා විසින් සිය අත්සන සහ නිල මුද්‍රාව යොදා සහතික කරන ලද යම් අමතර කොන්දේසි පනවා ඇත්නම්, එලෙස පනවනු ලබන කොන්දේසිද අවසර පත්‍ර හිමියා විසින් පිළිපැදිය යුතුය.

05. අපනයන කරනු ලබන්නේ දැව කඳන් හෝ ඉරන ලද දැව නම් අවසරපත්‍රයේ සඳහන් මුද්‍රා සළකුණ දැව කඳන් මත මෙන්ම ඉරන ලද දැව කැබලි මතද තිබිය යුතුය.

වන සංරක්ෂණ ආඥා පනතේ (451 වැනි අධිකාරය වූ ) 24(1) (ජ) වගන්තිය යටතේ සාදන ලද ඉහත සඳහන් කොන්දේසි සහ නියමයන් පිළිපැදීමට මම එකග වෙමි.

.......................................... ..........................................................................

දිනය අවසරපත්‍ර හිමියාගේ අත්සන

EOG 08 - 0205/1

එල්.ඩී.බී 203/33 (VIII)

**(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 23අ, 23ආ, 23ඇ, 23ඈ සහ 28(3) වන වගන්ති සමග කියවිය යුතු 64 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නීතීඥ පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2023 අංක 02 දරන වන සංරක්ෂණ (දැව මඩු සහ දේපළ සළකුණු ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ආඥාපනතේ 23අ වගන්තියට අනුකූලව දැව මඩු ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට, ආඥාපනතේ 23ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, මෙම නියෝගවල I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය.

එසේ වුව ද, මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙරාතුව 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1979 අංක 3 දරන කැලෑ නියෝග යටතේ ලබාගත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රකාරව දැව මඩු ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකුට මෙම නියෝග යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන අතර එසේ ලබාගත් ලියාපදිංචි කිරීමේ සහතිකයක්, මෙම නියෝග යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

3. මෙම නියෝගවල II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන කටයුතුවල නියැලී සිටින 2 වන නියෝගයේ දක්වා ඇති දැව මඩුවක් පවත්වා ගෙන යාමේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, ඒ දැව මඩුව රජයේ වනයක හෝ වන වගාවක සිට මෙම නියෝගවල II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අවම ගුවන් දුර ප්‍රමාණය තුළ පිහිටා ඇත්නම්, ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

4. (1) දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරය සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමෙන් පසු, ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබූ තැනැත්තකු වෙත, දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා බලය පවරමින් වන සංරක්ෂක ජනරාල්වරයා විසින් අවසර පත්‍රයක් ද නිකුත් කරනු ලැබිය යුතු ය. අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය මෙම නියෝගවල VIII වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ සහතිකය සහ අවසර පත්‍රය මෙම නියෝගවල පිළිවෙළින් III වන සහ IV වන උපලේඛනවල දක්වා ඇති ආකෘති පත්‍රවලට අනුකූලව විය යුතු ය. කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, ලියාපදිංචි කිරීමේ සහතිකය දැව මඩු ව්‍යාපාරය ක්‍රියාත්මකව පවතිනතාක්දුරට වලංගු විය යුතු අතර අවසර පත්‍රය එම අවසර පත්‍රයේ සඳහන් කාලසීමාව සඳහා වලංගු විය යුතු ය.

5. (1) මෙම නියෝගවල V වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති දැව මඩු ලියාපදිංචි කිරීම සඳහා වන ගාස්තු එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) මෙම නියෝගවල V වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන දැව මඩු ව්‍යාපාරයක් කර ගෙන යාම සඳහා වූ අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ වාර්ෂික ගාස්තු එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

එසේ වුව ද, මේ නියෝග ක්‍රියාත්මක වීමට පෙරාතුව 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1979 අංක 3 දරන කැලෑ නියෝගවල විධිවිධාන ප්‍රකාර, වත්මන් වර්ෂය සඳහා අවසර පත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින් වත්මන් වර්ෂය සඳහා වාර්ෂික ගාස්තුව ගෙවීමට අවශ්‍ය නොවන්නේ ය.

6. දැව මඩුව සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ අවසර පත්‍රය දැව මඩුවේ අයිතිකරු විසින් එම දැව මඩුවේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

7. (1) දැව මඩුවක් ලියාපදිංචි කිරීමෙන් පසු වන සංරක්ෂක ජනරාල්වරයා විසින් එම දැව මඩුවට ආවේණික වූ දේපළ සලකුණක් පවරනු ලැබිය යුතු ය.

(2) යම් දැව මඩුවක් සම්බන්ධයෙන් එහි ආකෘතිය, ප්‍රමාණය සහ සුවිශේෂී ඉලක්කම් හා අක්ෂරය, අදාළ දැව මඩුව ලියාපදිංචි කරන අවස්ථාවේ දී එහි පරිපාලන දිස්ත්‍රික්කය සහ වෙනත් සමාන අවශ්‍යතා සැලකිල්ලට ගෙන, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(3) වන සංරක්ෂක ජනරාල්වරයා විසින් දෙන ලද මාන අනුව වූ දේපළ සලකුණක් දැව මඩුවේ අයිතිකරු වෙත නිකුත් කර ඇති බවට එම අයිතිකරු වෙත වහාම දැනුම් දිය යුතු අතර එම අයිතිකරු, එම දේපළ සලකුණ, දැව මත මතුවී පෙනෙන පරිදි ලෝහමය ද්‍රව්‍යවලින් සාදා, දැව කැබැල්ලක් මත සවිකර තැබීමට කටයුතු කළ යුතු ය.

(4) දැව මඩුවේ අයිතිකරු විසින් ඉන් පසුව එක් එක් පැත්තක සෙන්ටිමීටර් විස්සක් (සෙ.මී 20) දිග සෙන්ටිමීටර් විස්සක් පළල හතරැස් කොටු හැඩති කඩදාසි කොළයක් මත එම දේපළ සලකුණ තැබිය යුතු ය. ඉන් පසු ඔහු විසින් ඔහුගේ නම, දිනය, සහ අත්සන එම කොළය මත තබා, දේපළ සලකුණ තමා වෙත නිකුත් කිරීමෙන් පසු එක් මසක් ඇතුළත, දැව මඩුව පිහිටි ප්‍රදේශයේ දිසා වන නිලධරයා වෙත එම කඩදාසිය ඉදිරිපත් කළ යුතු ය.

8. යම් දැව මඩුවකින් විකුණනු ලබන දැව ඇතුළුව එම දැව මඩුවේ තැන්පත් කර ඇති සියලු ලී කඳන්වල සහ ඉරන ලද දැව මත අදාළ මඩුව වෙත නිකුත් කර ඇති දේපළ සලකුණ තැබිය යුතු ය.

9. (1) එක් එක් දිනයේ දී කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තා ඇතුළත් පහත දැක්වෙන ලේඛන දැව මඩුවේ අයිතිකරු විසින් පවත්වාගෙන යා යුතු යඃ-

(අ) දැව කඳන්වලට අදාළව මෙම නියෝගවල VI වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූලව ලේඛනයක්; හෝ

(ආ) ඉරූ දැවවලට අදාළව මෙම නියෝගවල VII වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූලව ලේඛනයක්.

(2) යම් දැව මඩුවක පවත්වාගෙන යනු ලබන ලේඛනවල සඳහන් කර ඇති දැව තොගය එම දැව මඩුවේ භෞතිකව ඇති දැව තොගය සමග සැසඳීමේ දී, සෑම අවස්ථාවක දී ම සමාන විය යුතු ය.

(3) (අ) දැව මඩුවක හිමිකරු විසින්, එළඹෙන මාසයේ දහවන දිනයට පෙරාතුව එක් එක් මාසය අවසානයේ දී දැව කඳන්වලට අදාළව මෙම නියෝගවල VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ඒ මාසය සඳහා වූ ලේඛනයේ සියලු තොරතුරු ඇතුළත් සහතික කළ උද්ධෘතයක් දැව මඩුව පිහිටා ඇති ප්‍රදේශයේ අඩවි වන නිලධරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(ආ) සීතාවක හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටා ඇති දැව මඩු හැර කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති දැව මඩු සම්බන්ධයෙන් වන විට දී, සහතික කළ උද්ධෘතය බස්නාහිර / වයඹ කලාපය භාර නියෝජ්‍ය වන සංරක්ෂකවරයා වෙත යැවිය යුතු ය.

10. (1) දැව මඩු ව්‍යාපාරයක් කර ගෙන යාම සඳහා වූ අවසර පත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් මෙම නියෝගවල VIII වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර පවතින අවසර පත්‍රය ඉකුත් වීමට අවම වශයෙන් මසකටවත් පෙරාතුව වන සංරක්ෂක ජනරාල්වරයා වෙත භාරදිය යුතු ය.

(2) මෙම නියෝගවල V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වාර්ෂික ගාස්තු, දැව මඩු ව්‍යාපාරයක් කර ගෙන යාමේ අවසර පත්‍රයක් අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ය.

(3) හිමිකරු, (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අවසර පත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලීමක් භාරදීමට අපොහොසත් වන්නේ නම්, අවසර පත්‍රය ඉකුත්වීමෙන් පසුව අලුත් කිරීම සඳහා එසේ ඉල්ලුම් කිරීමට ප්‍රමාද කර ඇති එක් එක් මාසය හෝ ඉන් කොටසක් සඳහා වැඩිපුර ගාස්තුවක් ලෙස නියමිත අවසර පත්‍රයේ ගාස්තුවෙන් සියයට දහයක මුදලක් වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය. වලංගු හේතුවක් නොමැතිව, මාස හයකට වැඩි කාලයක් සඳහා අවසර පත්‍රය අලුත් කිරීමට අපොහොසත් වීම ලියාපදිංචි සහතිකය අවලංගු කිරීමට හේතු විය යුතු ය.

11. (1) ලියාපදිංචිය සහ අවසර පත්‍රය අත්හිටුවා ඇත්තේ යම් දැව මඩුවක ලියාපදිංචි හිමිකරුවකුගේ ද, ඔහු විසින් එම අත්හිටුවීමේ කාලසීමා ඉකුත් වීමෙන් පසුව දැව මඩු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අරමුණු කරන්නේ නම්, එම අත්හිටුවීමේ කාලසීමාව ඉකුත් වන දින සිට මසක කාලසීමාවක් ඉකුත් වීමට පෙරාතුව අලුත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් හා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යුතු ය. ලියාපදිංචි සහතිකයේ සහ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට ඔහු ප්‍රමාද වන්නේ නම් කිසිදු ලියාපදිංචි සහතිකයක් හෝ අවසර පත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

(2) (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කළ පරිදි ප්‍රමාදයක් පැවතී ඇති අවස්ථාවක දී, වන සංරක්ෂක ජනරාල්වරයා විසින් ලියාපදිංචි සහතිකයක් සහ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් හිමිකරු වෙත දැනුම් දිය යුතු ය.

(3) දැව මඩුවේ හිමිකරු විසින්, ලියාපදිංචි තැපෑලෙන් දැන්වීම ලැබුණු පසුව අවසර පත්‍රය අත්හිටවූ දින සිට දින තිහක් ඇතුළත වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(4) (1) වන ඡේදයේ සඳහන් කරන ලද කාලසීමාව තුළ දී දැව මඩුවේ හිමිකරු විසින් ප්‍රමාණවත් සහ සාධාරණ හේතු ලබා දී නොමැති නම්, වන සංරක්ෂක ජනරාල්වරයා විසින්, දැව මඩුවේ ලියාපදිංචි සහතිකය සහ අවසර පත්‍රය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සහතික කළ යුතු අතර ඒ පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් දැව මඩුවේ හිමිකරු වෙත දැනුම් දිය යුතු ය.

12. (1) ආඥාපනතේ 23ඇ වගන්තිය අනුව ලියාපදිංචිය අවලංගු කර ඇති දැව මඩුවක අයිතිකරු විසින් වන සංරක්ෂක ජනරාල්වරයාගේ අනුමතය ඇතිව එසේ අවලංගු වීමේ දින සිට මාස තුනක් ඇතුළත තම දැව මඩුවේ ඇති සියලු දැව වෙනත් යම් ලියාපදිංචි දැව මඩුවක අයිතිකරුට හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට විකිණීම නිත්‍යානුකූල වන්නේ ය. එවැනි දැව තොගයක් ප්‍රවාහනය කිරීම සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ආඥාපනතේ 23ඇ වගන්තිය අනුව දැව මඩුවක ලියාපදිංචිය අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ අවලංගු කිරීමේ දිනයේ සිට වසර හයක කාලසීමාවක් ඉකුත්වන තෙක් අවලංගු කළ දැව මඩුව පිහිටා තිබූ ඒ ඉඩමේ අලුත් දැව මඩුවක් ලියාපදිංචි නොකළ යුතු ය.

13. (1) (අ) දැව මඩුවක් සම්බන්ධයෙන් වන සංරක්ෂක ජනරාල්වරයා විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකයක්, වන සංරක්ෂක ජනරාල්වරයා හෝ වන සංරක්ෂක ජනරාල්වරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත ලියාපදිංචි හිමිකරු සහ අපේක්ෂිත හිමිකරු යන දෙදෙනා විසින් ම ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් වෙනත් තැනැත්තකුට පවරනු ලැබිය හැකි ය.

(ආ) (1) වන ඡේදයේ නියමයන්ට අනුව ලියාපදිංචියක් පැවරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම මෙහි 1 වන උපලේඛනය දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලියාපදිංචි සහතිකයක් සඳහා අපේක්ෂිත හිමිකරුගේ ඉල්ලීමක් සහ ලේඛනයේ සටහන් සමග දැව මඩුවේ දැව තොග සහ ඉරන ලද දැව අලුත් හිමිකරු විසින් ම සත්‍යාපනය කරන ලද බවට ප්‍රකාශයකින් සමන්විත විය යුතු ය.

(ඇ) දැව මඩුවේ දැව තොග සහ ඉරූ දැව ලේඛනයේ සඳහන් සටහන් නොගැළපෙන අවස්ථාවක දී ඒ වෙනස සඳහා හේතු දක්වමින් වූ ප්‍රකාශයක් අදාළ ඉල්ලීමක් සමග වන සංරක්ෂක ජනරාල්වරයා වෙත භාරදිය යුතු ය.

(2) (අ) වන සංරක්ෂක ජනරාල්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු විසින් අපේක්ෂිත හිමිකරුගේ නමට දැව මඩුවේ ලියාපදිංචිය පැවරීම අනුමත කරන අවස්ථාවක දී, කලින් සහතිකය

නොපමාව අවලංගු කළ යුතු අතර දැව මඩු ව්‍යාපාරයක් කරගෙන යෑමට හැකි වන ලෙස ලියාපදිංචි සහතිකයක් සහ අවසර පත්‍රයක්, මෙම නියෝගවල විධිවිධානවලට යටත්ව අලුත් හිමිකරුට නිකුත් කළ යුතු ය.

(ආ) ඒ ලියාපදිංචි සහතිකය සහ අවසර පත්‍රය සම්බන්ධයෙන් මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමට අපේක්ෂිත හිමිකරුට නියම කළ යුතු ය.

14. (1) දැව මඩුවක ලියාපදිංචි අයිතිකරු විසින් යම් නිශ්චිත කාලයක් සඳහා දැව මඩුව වසා තැබීමට අදහස් කරන අවස්ථාවක, එසේ වසා දැමීමට අදහස් කරන දිනයේ සිට යටත් පිරිසෙයින් දින තිහකටවත් පෙරාතුව වූ කාලසීමාවක් තුළ තම අදහස පිළිබඳව වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. වන සංරක්ෂක ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැව මඩුවක් වසා දැමීම පිළිබඳ දැන්වීමක් මෙම නියෝගවල IX වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතු අතර එම දැන්වීම නිකුත් කිරීමේ දින සිට අවුරුදු දෙකක උපරිම කාලයක් සඳහා වලංගුව පැවතිය යුතු ය.

(2) (1)වන ඡේදයේ ප්‍රකාර තම දැව මඩුව වසා දමා ඇති දැව මඩුවක හිමිකරුවකු විසින් නැවත වරක් දැව මඩු ව්‍යාපාරය ආරම්භ කිරීමට අදහස් කරන අවස්ථාවක, එම කාර්යය සඳහා තමා වෙත නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකය සහ අවසර පත්‍රය දැව මඩුව අයිතිකරු විසින් අලුත් කළ යුතු ය.

එසේ වුව ද, අදාළ දැව මඩුව වසා දැමූ දින සිට අවුරුදු දෙකක කාලයකට පසුව එම දැව මඩුවේ ලියාපදිංචිය අලුත් කිරීම නොකළ යුතු අතර, දැව මඩුව නැවත විවෘත කිරීමට එහි අයිතිකරු අදහස් කරන්නේ නම්, ඔහු මෙහි 3 වන සහ 4 වන නියෝගවල විධිවිධානයන්ට අනුව ක්‍රියා කළ යුතු අතර ඔහු විසින් අලුත් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර අලුත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාගත යුතු ය.

(3) (2)වන ඡේදයේ සඳහන් දැව මඩුවේ අයිතිකරු විසින් දැව මඩුව වසා දැමීම පිළිබඳ දැනුම් දෙමින් යවන ලද ලිපියේ පිටපතක් ද සහිතව දැව මඩුව නැවත විවෘත කිරීමේ දිනයට යටත් පිරිසෙයින් දින තිහකටවත් පෙර වන සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතු ය. නිසි පරිදි වූ විමර්ශනයක් සිදු කිරීමෙන් පසු, ඉල්ලීම ලැබුණු දින සිට දැව මඩුවේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන සංරක්ෂක ජනරාල්වරයා විසින් අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ අවසර පත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) (3)වන ඡේදයේ සඳහන් පරිදි අලුත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් සහ අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී, දැව මඩුව වසා තිබූ කාලය සඳහා කිසිදු හිඟ මුදලක්, ලියාපදිංචි ගාස්තුවක් හෝ වෙනත් අධිභාරයක් අයකරනු නොලැබිය යුතු ය.

15. ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව දැව මඩු පරීක්ෂා කිරීමට වන නිලධරයකු හෝ බලයලත් නිලධරයකුට, ඕනෑම සාධාරණ කාල සීමාවක දී එහි ගබඩා කර ඇති දැව සහ ඉරූ දැව පරීක්ෂා කිරීමේ සහ ඒ දැව මඩුවේ තොරතුරු සටහන් කර ගැනීමේ කාර්යය සඳහා ඕනෑම දැව මඩුවකට ඇතුළු විය හැකි ය. දැව මඩුවේ හිමිකරු විසින් පවත්වාගෙන යන සියලු දැව, ලේඛන සහ වාර්තා පිළිබඳ යම් බලයලත් නිලධරයකුට දැන ගැනීමට සැලැස්වීම සහ දැව මඩුව පරීක්ෂා කිරීම සඳහා පහසුකම් සැලැස්වීමේ කාර්යය සඳහා ඔහුගෙන් අවශ්‍ය කරනු ලැබිය හැකි සියලු සහායයන් ලබාදීම ඔහුගේ කාර්යය විය යුතු ය.

16. දැව මඩු පරීක්ෂා කිරීමට බලය දෙන ලද නිලධරයකු විසින් යම් දැව මඩුවක් පරීක්ෂා කරගෙන යන අවස්ථාවක දී ගබඩා කර ඇති සියලු දැව නීත්‍යානුකූලව ඔහුගේ සන්තකයේ සහ පාලනයේ තිබූ බවට ඔප්පු කිරීම ඒවායේ හිමිකරුගේ කාර්යය විය යුතු ය.

17. 3වන, 6වන, 7වන, 8වන, 9වන, 12වන, 13වන, 15වන සහ 16වන නියෝගවල විධිවිධාන හැර, මෙම නියෝගවල විධිවිධානවලට- අමතරව පහත දැක්වෙන විධිවිධාන, ජංගම ලී මෝලක් සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු යः-

(අ) සෑම ජංගම ලී මෝලක්ම ආඥාපනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවකට අනුකූලව කපා බිම හෙලන ලද දැව ඉරීමේ කාර්යය සඳහා පමණක්, ඒ ජංගම ලී මෝල පිහිටා ඇති පුද්ගලික ඉඩම තුළ දී භාවිත කරනු ලැබිය යුතු ය;

(ආ) ජංගම ලී මෝලක් භාවිත කරමින් දැව ඉරීමට අරමුණු කරන යම් තැනැත්තකු දැව ඉරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව, ජංගම ලී මෝල ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ අඩවි වන නිලධරයාගෙන් හෝ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඒ දැව පුද්ගලික ඉඩමකින් ලබා ගෙන ඇති බව තහවුරු කිරීම පිණිස සහතිකයක් ලබා ගත යුතු ය;

එසේ වුව ද, (452 වන අධිකාරය වූ) ගස් හෙළීම (පාලනය කිරීමේ) පනත යටතේ ගස් හෙළීම සඳහා භාවිතා කරන ගස් හෙළීමේ අවසර පත්‍රයක් දරන යම් තැනැත්තකු මේ නියෝග යටතේ වූ සහතිකයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය;

(ඇ) (ආ) අනු ඡේදයේ සඳහන් කරන ලද සහතිකය මෙම නියෝගවල X වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු ය;

(ඈ) දැව ඉරීම සිදු කරගෙන යන විට, එහි ක්‍රියාකරු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය සහ ජංගම ලී මෝල සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය සහ (ආ) අනුඡේදයේ සඳහන් කරන ලද සහතිකය තම සන්තකයේ තබා ගත යුතු ය;

(ඉ) ජංගම ලී මෝල සවිකර ඇති අත් ට්‍රැක්ටරය හෝ ට්‍රේලරය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ තිබිය යුතු අතර අදාළ වර්ෂය සම්බන්ධයෙන් වාහන ආදායම් බලපත්‍රයක් ද සන්තකයේ තිබිය යුතු ය. දැව ඉරීම සිදුකරගෙන යන විට එකී බලපත්‍රය සියලු අවස්ථාවන්හි දී යන්ත්‍ර ක්‍රියාකරුගේ සන්තකයේ පැවතිය යුතු ය;

(ඊ) ජංගම ලී මෝල ලියාපදිංචි කිරීම ඉල්ලුම්කරු ස්ථිරව පදිංචි වී සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දී පමණක් සිදුකරනු ලැබිය යුතු ය;

(උ) ඉල්ලුම්කරු ජංගම ලී මෝල සවිකර තිබෙන අත් ට්‍රැක්ටරයේ ලියාපදිංචි අයිතිකරු විය යුතු ය;

(ඌ) දැව ඉරීම සිදුකරගෙන යන ඉඩමට රජයේ වනයක හෝ වන වගාවක සිට අවම ගුවන් දුර ප්‍රමාණය මීටර් 200 කට අඩු නොවිය යුතු ය;

(එ) අවසර පත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී, අත් ට්‍රැක්ටරයේ වාර්ෂික වාහන ආදායම් බලපත්‍රය ද භාරදෙනු ලැබිය යුතු ය;

(ඒ) ලියාපදිංචි සහතිකයේ සඳහන් කරන ලද අත් ට්‍රැක්ටර් ට්‍රේලරය හැර කිසිදු වාහනයකට හෝ යන්ත්‍රයකට ජංගම ලී මෝල සවිකරනු නොලැබිය යුතු ය;

(ඔ) ජංගම ලී මෝල සඳහා භාවිතා කරන කියත් තලයේ විෂ්කම්භය සෙන්ටිමීටර් 75 කට (අඟල් 30 කට) වඩා අඩු විය යුතු ය;

(ඕ) ජංගම ලී මෝල සෑම දිනක ම පෙරවරු 06.00 සිට පස්වරු 06.00 දක්වා පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ක) ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර දැව මඩුවක් පරීක්ෂා කිරීමට බලයලත් නිලධරයකු විසින් ලී මෝල ක්‍රියාත්මකව පවතින ඕනෑම අවස්ථාවක දී, ඕනෑම ජංගම ලී මෝලක් පරීක්ෂා කරනු ලැබිය හැකි අතර ඒ සඳහා අවශ්‍ය සියලු සහාය ලබා දීම ජංගම ලී මෝල අයිතිකරුගේ සහ ජංගම ලී මෝල ක්‍රියාත්මක කරන ඉඩමේ අයිතිකරුගේ කාර්යය විය යුතු ය.

18. මෙම නියෝගවල -

"ලියාපදිංචි කිරීමේ සහතිකය" යන්නෙන් දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ආඥාපනතේ 23අ වගන්තිය යටතේ ලබා ගැනීමට නියම කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අදහස් වේ;

"වන සංරක්ෂක ජනරාල්වරයා" යන්නෙන්, ආඥාපනතේ නියමයන්ට අනුව පත්කරන ලද වන සංරක්ෂක ජනරාල්වරයා අදහස් වේ;

"ජංගම ලී මෝල" යන්නෙන්, ස්ථිර වශයෙන් පොළවට සවි නොකර, අත් ට්‍රැක්ටරයක් උඩ සවිකර දැව ඉරීමට භාවිත කරන ලී මෝලක් අදහස් වේ;

"ආඥාපනත" යන්නෙන්, (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත අදහස් වේ;

"දැව මඩුවේ අයිතිකරු" යන්නට, දැව මඩුව පරිපාලනය කරන්නා වූ නියෝජිතයකු හෝ යම් සේවා නියුක්තයකු ඇතුළත් වේ;

"අවසර පත්‍රය" යන්නෙන්, දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් කර ගෙන යාමට ආඥාපනතේ 23අ වගන්තිය යටතේ ලබා ගැනීමට නියම කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ;

"දැව මඩුව" යන්නට, ආඥාපනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

19. කලින් කල සංශෝධිත පරිදි සහ 1986 නොවැම්බර් මස 26 වන දින අංක 429/8 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධිත, 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/14 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1979 අංක 3 දරන කැලෑ නියෝග සහ 1980 මාර්තු මස 20 වන දින අංක 80/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 28 වන වගන්තිය යටතේ වන නිවේදනය, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

### I වන උපලේඛනය

(2 සහ 13 වන නියෝග)

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*
*වන සංරක්ෂණ ආඥාපනතේ 23ආ වන වගන්තිය යටතේ දැව මඩුවක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය*
*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :
   ස්ථිර ලිපිනය :
   ජා.හැ. අංකය :
   (ඉල්ලුම්කරු සමාගමක් වන අවස්ථාවක දී ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය.)

2. දැව මඩුව පිහිටා ඇති ස්ථානයේ ලිපිනය :
   ඉඩමේ නම :
   ඉඩමේ අයිතිකරු :
   (කරුණාකර අයිතිය සනාථ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කරන්න)

3. දැව මඩුවේ නම :

4. දැව මඩුවේ ස්වාභාවය :
   (තම ව්‍යාපාරයේ ස්වභාවය අයත් කාණ්ඩය කුමක් දැයි අදාළ කොටුව තුළ "✓" යොදා සළකුණු කරන්න)

(අ) ඉරුම්හල්
- (i) ඉරුම්හල් (දැව ඉරීම පමණි) ☐
- (ii) ජංගම ලී මෝල් (දැව ඉරීම පමණි) ☐

(ආ) දැව විකුණුම්හල් ☐
(දැව විකිණීම පමණයි යන්ත්‍ර භාවිත කළ නොහැකිය)

(ඇ) දැව පදම් කිරීම හා පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත ශාලාව ☐
(කඳන් ඉරීමට සහ දැව අලෙවියට අවසර නැත)

(ඈ) වඩු මඩුව
(දැව කඳන් ගබඩා කිරීමට සහ දැව අලෙවි කිරීමට අවසර නැත)

(ඉ) දැව ගෘහ භාණ්ඩ සාප්පුව ☐
(නිමි ගෘහ භාණ්ඩ අලෙවිය සඳහා පමණි. යන්ත්‍ර භාවිත කිරීමට අවසර නැත)

(ඊ) දර මඩු

5. දැව මඩුව පිහිටි ස්ථානය පිළිබඳ විස්තර :
- (i) දිස්ත්‍රික්කය :
- (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
- (iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :
- (iv) පළාත් පාලන ආයතන ප්‍රදේශය :

6. ජංගම ලී මෝලක් සම්බන්ධයෙන් වන විට

(i) අත්ට්‍රැක්ටරයේ ලියාපදිංචි අංකය :

(ii) ට්‍රේලරයේ ලියාපදිංචි අංකය :
(ලියාපදිංචි සහතිකයේ සහ ආදායම් බලපත්‍රයේ පිටපතක් ඇමිණිය යුතු ය)

7. ජංගම ලී මෝල භාවිත කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

8. ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කිරීමට අදහස් කරන දිනය :

9. පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ වලංගු කාලය :
(පිටපතක් අමුණන්න)

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු, මාගේ විශ්වාසය හා දැනුම අනුව සත්‍ය වූත්, නිවැරදි වූත් තොරතුරු බව මම මෙයින් සහතික කරමි. තවද, දැව මඩුවක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරය (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතට සහ වන සංරක්ෂණ ආඥාපනත යටතේ පළ කරන ලද නියෝගවලට අනුව කරගෙන යන බවට ද මම මෙයින් එකඟ වෙමි.

දිනය :

ඉල්ලුම්කරුගේ අත්සන

*සැ.යු.* : මෙම අයදුම්පත සම්පූර්ණ කර පිටපත් 3 කින් යුත්කව ප්‍රදේශයේ දිසා වන නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. කොළඹ දිස්ත්‍රික්කයේ (සීතාවක සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හැර) අයදුම්පත කලාප නියෝජ්‍ය වන සංරක්ෂක, අංක 60, අකුරේගොඩ පාර, පැලවත්ත, තලංගම දකුණ වෙත එවිය යුතු ය. සීතාවක සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අයදුම්පත් කළුතර දිසා වන නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.

**II වන උපලේඛනය**

(3 වන වගන්තිය)

| *I වන තීරය* | *II වන තීරය* | | |
|---|---|---|---|
| දැව මඩුවේ ස්වභාවය | රජයට අයත් හෙක්ටයාර් 40 කට නොඅඩු, කැලෑවක සිට/හෙක්ටයාර් 20කට නොඅඩු වන වගාවක සිට දැව මඩුවට ඇති අවම ගුවන් දුර ප්‍රමාණය | | |
| | මහ නගර සභා සීමාව තුළ (කි.මී. වලින්) | නගර සභා සීමාව තුළ (කි.මී. වලින්) | ප්‍රාදේශීය සභා සීමාව තුළ (කි.මී. වලින්) |
| 1. ලී මෝල් | 1 | 1 | 2 |
| 2. දැව විකුණුම්හල් | 0.5 | 0.5 | 1 |
| 3. දැව පදම් කිරීමේ සහ පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත ශාලා | 0.5 | 0.5 | 1 |
| 4. වඩු මඩු | 0.5 | 0.5 | 1 |
| 5. ගෘහ භාණ්ඩ වෙළෙඳසැල් | දුර සීමාව අදාළ නොවේ | | |
| 6. දර මඩු | 0.5 | 0.5 | 1 |

**III** වන උපලේඛනය

(4 වන වගන්තිය)

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*
*දැව මඩුවක් ලියාපදිංචි කිරීමේ සහතිකය (23 ආ වගන්තිය)*
*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

දිස්ත්‍රික්කය : ලියාපදිංචි අංකය :

1. දැව මඩුවේ නම :

2. දැව මඩුවේ ලිපිනය :

3. දැව මඩුවේ අයිතිකරුගේ විස්තර :

   (i) සම්පූර්ණ නම :
   (ii) ස්ථිර ලිපිනය :
   (iii) ජාතික හැඳුනුම්පත් අංකය :

4. දැව මඩුවේ ස්වභාවය :

5. ජංගම ලී මෝලක් සම්බන්ධයෙන් වන විට,

   (i) අත්ට්‍රැක්ටරයේ ලියාපදිංචි අංකය :
   (ii) ට්‍රේලරයේ ලියාපදිංචි අංකය :
   (iii) ජංගම ලී මෝල ක්‍රියාත්මක කළ හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

6. දැව මඩුව සඳහා දේපළ සළකුණ :

.............................................
වන සංරක්ෂක ජනරාල්/
නියෝජ්‍ය වන සංරක්ෂක/
දිසා වන නිලධාරී.

............................................................
කාර්යාලයේ දී ය.
දිනය :

දැව මඩුවේ ස්වභාවය වෙනස් කිරීමට අවශ්‍ය වූ විට හෝ වෙනත් යම් කාරණයක දී ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කළ නිලධරයා වෙත ප්‍රමාදයකින් තොරව ඉල්ලීමක් කළ යුතු ය.

**IV** වන උපලේඛනය

(4 වන නියෝගය)

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*
*දැව මඩු ව්‍යාපාරයක් කරගෙන යාමේ අවසර පත්‍රය (23ආ වන වගන්තිය)*

දිස්ත්‍රික්කයඃ- ලියාපදිංචි අංකය

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 23 ආ වගන්තිය යටතේ ඉහත ලියාපදිංචි අංකය දරන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති දැව මඩුවකට වන සංරක්ෂණ ආඥාපනතේ නියමය පරිදි දැව මඩුවේ ලියාපදිංචිය කලින් අවලංගු කර නැත්නම් පහත දැක්වෙන පරිදි ................... සිට ................... දක්වා දැව මඩු ව්‍යාපාරයක් කරගෙන යාම පිණිස අවසර පත්‍රයක් මෙයින් ප්‍රදානය කරනු ලැබේ.

1. දැව මඩුවේ නමඃ-
2. දැව මඩුවේ ලිපිනයඃ-
3. දැව මඩුවේ අයිතිකරු පිළිබඳ තොරතුරුඃ-

   (i) සම්පූර්ණ නම ඃ
   (ii) ස්ථිර ලිපිනය ඃ
   (iii) ජාතික හැඳුනුම්පත් අංකය ඃ

4. දැව මඩුවේ ස්වභාවය ඃ-

5. ජංගම ලී මෝලක් සම්බන්ධයෙන් වන විට

   (i) අත්ට්‍රැක්ටරයේ ලියාපදිංචි අංකය ඃ
   (ii) ට්‍රේලරයේ ලියාපදිංචි අංකය ඃ
   (iii) ජංගම ලී මෝල ක්‍රියාත්මක කළ හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඃ

6. දැව මඩුවට අයත් දේපළ ලකුණ ඃ-

........................................... දින ..............................................................
කාර්යාලයේ දී ය. වන සංරක්ෂක ජනරාල්/
බලයලත් නිලධරයා

*කොන්දේසි*

- ✸ දැව මඩුවේ හිමිකරු හෝ ඔහුගේ අනුයෝජිතයකු (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය වන ක්‍රියාවක් නොකළ යුතු ය.

- ✸ දැව මඩුවේ අයිතිකරු හෝ ඔහුගේ අනුයෝජිතයකු තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියකට අදාළ යම් විධිවිධානයක් උල්ලංඝනය වන පරිදි ක්‍රියා නොකළ යුතු ය.

- ✸ රජයේ දේපළක් වන දැව, දැව මඩුව පිහිටි භූමියේ ගබඩා නොකළ යුතු ය.

- ✸ දැව මඩුව පිහිටා ඇති ඉඩමේ හිමිකාරිත්වය දැව මඩුවේ අයිතිකරුගෙන් මාරුවන අවස්ථාවක එම ලියාපදිංචි සහතිකය අවලංගු කර එය ඉඩමේ අලුත් හිමිකරු වෙත මාරු කිරීමට එය නිකුත් කළ නිලධරයාට භාර දිය යුතු ය.

**V වන උපලේඛනය**

(5,10 වන 13 වන නියෝග)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| දැව මඩුවේ ස්වභාවය | ලියාපදිංචිය සඳහා ගාස්තු රු. | වාර්ෂික අවසරපත් ගාස්තුව සහ එය අලුත් කිරීමේ ගාස්තුව රු. |
| 1. දැව ඉරුම්හල | 5750.00 | 5750.00 |
| 2. ජංගම ලී මෝල | 5750.00 | 5750.00 |
| 3. දැව විකුණුම්හල | 3450.00 | 3450.00 |
| 4. දැව පදම් කිරීමේ හා පිරිසැකසුම් කර්මාන්ත ශාලාවක් | 5750.00 | 5750.00 |
| 5. වඩු මඩුවක් | 870.00 | 870.00 |
| 6. ගෘහ භාණ්ඩ වෙළෙඳසැල | 580.00 | 580.00 |
| 7. දර මඩුවක් | 170.00 | 170.00 |

**VI වන උපලේඛනය**

(9 වන නියෝගය)

| දිනය | ආරම්භක තොගය (කඳන්) | | | ලැබුණු තොගය | | | කඳන් ලැබුණ මූලාශ්‍රය අවසරපත් අංකය: දිනය: නිකුත් කළ නිලධාරියාගේ තනතුර | විකුණන ලද කඳන් තොගය | | | අවසන් තොගය (කඳන්) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ගය | පරිමාව ($dm^3$/ $ft^3$) | කඳන් ගණන | වර්ගය | පරිමාව ($dm^3$/$ft^3$) | කඳන් ගණන | | වර්ගය | පරිමාව ($dm^3$/ $ft^3$) | කඳන් ගණන | වර්ගය | පරිමාව ($dm^3$/$ft^3$) | කඳන් ගණන |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

# **VII** වන උපලේඛනය

(9 වන නියෝගය)

| දිනය | ආරම්භක තොගය | | ලැබුණු ඉරූ දැව | | | | | විකුණන ලද ඉරූ දැව | | අවසන් තොග ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ගය | පරිමාව ($dm^3/ft^3$) | පිටතින් | | දැව ලැබුණු මූලාශ්‍රය | ඉරීමෙන් වූ වෙනස | | | | | |
| | | | වර්ගය | පරිමාව ($dm^3/ft^3$) | | වර්ගය | පරිමාව ($dm^3/ft^3$) | වර්ගය | පරිමාව ($dm^3/ft^3$) | වර්ගය | පරිමාව ($dm^3/ft^3$) |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

**VIII** වන උපලේඛනය

(4 වන සහ 10 වන නියෝග)

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*

*දැව මඩු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා අවසර පත්‍රය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය*

1. දැව මඩුවේ හිමිකරුගේ සම්පූර්ණ නම : ..........................................................................................................................................

ස්ථිර ලිපිනය : ..........................................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................................................
(ඉල්ලුම්කරු සමාගමක් වේ නම් ලියාපදිංචි කිරීමේ සහතිකය ඇමිණිය යුතු ය.)

2. දැව මඩුවේ ලිපිනය : ..........................................................................................................................................

3. දැව මඩුවේ නම : ..........................................................................................................................................

4. (අ) දැව මඩුවේ ලියාපදිංචි අංකය : ..........................................................................................

(ආ) පළමු ලියාපදිංචි දිනය : ..........................................................................................

5. දැව මඩුවේ ස්වභාවය : ..........................................................................................................................................

6. අවසන්වරට ලබාගත් අවසර පත්‍රයේ වලංගු කාල සීමාව :..........................................................................................................
(අවසන්වරට ගත් අවසරපතේ පිටපතක් අමුණන්න)

7. අලුත් අවසර පත්‍රය ඉල්ලා සිටින කාල සීමාව : ..........................................................................

8. ජංගම ලී මෝලක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී,

I අත් ට්‍රැක්ටරයේ ලියාපදිංචි අංකය

II ට්‍රේලරයේ ලියාපදිංචි අංකය

III ආදායම් බලපත්‍රයේ වලංගු කාලය
(ආදායම් බලපත්‍රයේ පිටපතක් අමුණන්න)

9. ජංගම ලී මෝල පවත්වාගෙන යා යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................

10. දැව මඩුවට අදාළව වන සංරක්ෂණ වැරදිවල තොරතුරු ඇත්නම් : ..........................................................................................

11. පරිසර සංරක්ෂණ බලපත්‍රයේ වලංගු කාලය
(පිටපතක් අමුණන්න)

මේ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අදාළව දැව මඩු ව්‍යාපාරයක් කරගෙන යාමට මම මෙයින් එකඟ වෙමි.

....................................................

දිනය : .................................... දැව මඩුවේ අයිතිකරුගේ අත්සන

සැ.යු. මෙම අයදුම්පත සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ප්‍රදේශයේ, දිසා වන නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. කොළඹ දිස්ත්‍රික්කයේ අයදුම්පත් (සීතාවක සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හැර) කලාප නියෝජ්‍ය වන සංරක්ෂක, අංක 60, අකුරේගොඩ පාර, පැලවත්ත, තලංගම දකුණ වෙත එවිය යුතු ය. සීතාවක සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අයදුම්පත් කළුතර දිසා වන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

**IX** වන උපලේඛනය

(14 වන නියෝගය)

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*
*දැව මඩුවක් වසා දැමීම පිළිබඳ දැන්වීම*

1. දැව මඩුවේ අයිතිකරුගේ සම්පූර්ණ නම :

ස්ථිර ලිපිනය :

2. දැව මඩුවේ නම සහ ලිපිනය :

3. ලියාපදිංචි අංකය :

4. දැව මඩුවේ ස්වාභාවය :

අ. ......................................................................................

ආ. ......................................................................................

ඇ. ......................................................................................

ඈ. ......................................................................................

ඉ. ......................................................................................

5. ජංගම ලී මෝලක් නම් අත්ට්‍රැක්ටරයේ සහ ට්‍රේලරයේ ලියාපදිංචි අංක :

6. ලියාපදිංචි කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

7. දැව මඩුව වසා දැමීමට ඉල්ලුම්කරන කාලසීමාව : ...................... දින සිට .................................... දින දක්වා

8. වසා දැමීම සඳහා අනුමත කාලසීමාව : ...................... දින සිට ....................................දින දක්වා

අවසර පත්‍රයට කිසිදු ගෙවීමක් කිරීමෙන් තොරව ඉහත සඳහන් කාල සීමාව තුළ ඔබගේ දැව මඩුව වසා දැමීමට මෙයින් අවසර දෙමි. දැව මඩුවේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට ඔබ අපේක්ෂා කරන විට එකී කාර්ය සඳහා ඔබවිසින් අවසරපතක් ලබාගත යුතු ය. එවැනි අවස්ථාවක දී මෙම දැන්වීමේ පිටපතක් ද සමඟ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට ලිඛිතව, ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දන්වා සිටිය යුතු අතර මෙම දැව ගබඩාව නැවත විවෘත කිරීමට දින තිහකට පෙරාතුව ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

වන සංරක්ෂක ජනරාල්/
නියෝජ්‍ය වන සංරක්ෂක/
දිසා වන නිලධාරී

නිකුත් කළ දිනය .......................................................

(17 වන නියෝගය)

**X වන උපලේඛනය**

*(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත*

*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

පෞද්ගලික ඉඩමක, ජංගම ලී මෝලක් භාවිත කර දැව ඉරීමට අපේක්ෂා කරන තැනැත්තකුට අඩවි වන නිලධාරී/ප්‍රාදේශීය ලේකම්-වරයා විසින් ඒ බව සනාථ කරමින් නිකුත් කරනු ලබන සහතිකය

01. අයදුම්කරුගේ නම :- ....................................................................................................................................

02. ලිපිනය :- ....................................................................................................................................
....................................................................................................................................

03. ඉඩමේ නම :- ....................................................................................................................................

04. (i) අඩවිය :- ....................................................................................................................................
(ii) බිට්ටුව :- ....................................................................................................................................
(ii) වන ක්ෂේත්‍ර සහකාර කොට්ඨාසය :- ....................................................................................................

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- ..........................................................................

06. ඔප්පුව/ප්‍රදාන/ගැසට් පත්‍රය/ අවසර පත්‍ර අංකය හා ලියාපදිංචි කළ දිනය :- ...............................................................

07. (i) පිඹුරු අංකය :- ....................................................................................................................................
(ii) බිම් කට්ටි අංකය :- ....................................................................................................................................

08. දැව පිළිබඳ විස්තරය :-

| *ගස් /කඳන් ගණන* | *වර්ගය* | *දැවවල මිණුම් (මී./සෙ.මී.)* | | |
|---|---|---|---|---|
| | | *පළල, උස, වට ප්‍රමාණය* | *මැද වට ප්‍රමාණය* | *දිග* |
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |
| 7. | | | | |

09 ගස්/කඳන් ගණන :- ....................................................................................................................................

10 නිලධාරියා යෙදූ මුද්‍රා සළකුණ :- ....................................................................................................................................

ඉහත සඳහන් පෞද්ගලික ඉඩමෙහි දැව (ගස්/කඳන්) තිබෙන බව මා විසින් සහතික කරනු ලබන අතර එම ඉඩමෙහි ජංගම ලී මෝලක් .......................................................... දින සිට ............................................................ දින දක්වා පවත්වාගෙන යාමට අවසර දෙමි.

20..................... ක් වූ ...................... මස ................... දින, ......
.............................................................. කාර්යාලයේ දී ය.

අඩවි වන නිලධාරී/ ප්‍රාදේශීය ලේකම්

පිටපත:- බිට්ටු වන නිලධාරී/ ග්‍රාම නිලධාරී ....................................................................................................

EOG 08 - 0205/2

එල්.ඩී.-බී 203/33 (VIII)

**(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

2008 මැයි මස 9 වන දින අංක 1548/29 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2008 අංක 01 දරන කැලෑ නියෝග, එහි පළමුවන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති එක් එක් ප්‍රදේශයට අදාළව මෙහි II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට මෙහි III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| *I වන තීරය*<br><br>*ප්‍රදේශය* | *II වන තීරය*<br><br>*ඉවත් කිරීම* | *III වන තීරය*<br><br>*ඇතුළත් කිරීම* |
|---|---|---|
| 1. කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ ටූනා | යුකැලිප්ටස් වර්ග, ටූනා සහ ගල් බම්බු |
| 2. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ ටූනා | යුකැලිප්ටස් වර්ග, ටූනා සහ ගල් බම්බු |
| 3. කළුතර පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ ටූනා | යුකැලිප්ටස් වර්ග, ටූනා සහ ගල් බම්බු |
| 4. මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව සහ ගිනි සපු | ආනයනික ඉරූ දැව, ගිනි සපු සහ ගල් බම්බු |
| 5. මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ ටූනා | යුකැලිප්ටස් වර්ග, ටූනා සහ ගල් බම්බු |
| 6. නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය | වේවැල් භාණ්ඩ හා ආනයනික ඉරූ දැව | වේවැල් භාණ්ඩ, ආනයනික ඉරූ දැව සහ ගල් බම්බු |
| 7. ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ ටූනා | යුකැලිප්ටස් වර්ග, ටූනා සහ ගල් බම්බු |
| 8. මාතර පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව සහ ටූනා | ආනයනික ඉරූ දැව, ටූනා සහ ගල් බම්බු |
| 9. හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව සහ ටූනා | ආනයනික ඉරූ දැව, ටූනා සහ ගල් බම්බු |

| *I වන තීරය*<br>*ප්‍රදේශය* | *II වන තීරය*<br>*ඉවත් කිරීම* | *III වන තීරය*<br>*ඇතුළත් කිරීම* |
|---|---|---|
| 10. යාපනය පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව සහ වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 11. මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |
| 12. වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |
| 13. මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |
| 14. කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |
| 15. අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 16. මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 17. ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 18. කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |
| 19. පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 20. අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 21. පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 22. මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව, වූනා | ආනයනික ඉරූ දැව, වූනා සහ ගල් බම්බු |
| 23. බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය | වේවැල් භාණ්ඩ සහ ආනයනික ඉරූ දැව | වේවැල් භාණ්ඩ, ආනයනික ඉරූ දැව සහ ගල් බම්බු |
| 24. රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය | ආනයනික ඉරූ දැව සහ යුකැලිප්ටස් වර්ග | ආනයනික ඉරූ දැව, යුකැලිප්ටස් වර්ග සහ ගල් බම්බු |
| 25. කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය | යුකැලිප්ටස් වර්ග සහ වූනා | යුකැලිප්ටස් වර්ග, වූනා සහ ගල් බම්බු |

එල්.ඩී.බී. 203/33 (**V**)

**(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3අ වගන්තියේ, (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති, 6 වන වගන්තිය සහ 64 වන වගන්තිය යටතේ වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

පවිත්‍රා වන්නිආරච්චි,
වනජීවි හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින
කොළඹ දී ය

නියෝග

1. (1) මේ නියෝග 2023 අංක 03 දරන වන සංරක්ෂණ (සංරක්ෂිත වනාන්තර) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2003.08.21 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) මේ නියෝගවල විධිවිධාන, ආඥාපනතේ 3අ වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත්කරන ලද සියලු සංරක්ෂිත වනාන්තර වලට අදාළ විය යුතු ය.

2. (1) ආඥාපනතේ 3අ වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංරක්ෂක ජනරාල්වරයා විසින් සකස්කරන ලද කළමනාකරණ සැලැස්මට-

(අ) සංරක්ෂිත වනාන්තර තුළ අනන්‍ය පරිසර පද්ධති, ජානමය සම්පත්, දුර්ලභ සහ ආවේණික වෘක්ෂලතා, වන සතුන් සහ ක්ෂුද්‍ර ජීවීන්ගේ වාසස්ථාන සහ තර්ජනයට ලක් වූ විශේෂවල ආරක්ෂාව සඳහා;

(ආ) ගංගා ලවණීකරණය සහ හිදී යාම වැළැක්වීමෙන් සහ නාය යෑම් සහ ගිනි ගැනීම් වැළැක්වීමෙන් සංරක්ෂිත වනාන්තරවල පාරිසරික සමතුලිතතාවක් සපුරා ගැනීම සඳහා,

පියවර අන්තර්ගත විය යුතු ය.

(2) කළමනාකරණ සැලැස්මට-

(අ) අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවල දී, සංරක්ෂිත වනාන්තරවල සමීක්ෂණ පැවැත්වීම සහ ඒවායෙහි මායිම් සලකුණු කිරීම සඳහා;

(ආ) අවශ්‍ය අවස්ථාවල දී සංරක්ෂිත වනාන්තර කලාපකරණය සඳහා;

(ඇ) සංරක්ෂිත වනාන්තර කළමනාකරණය සඳහා අවශ්‍ය විශේෂ කටයුතු සිදු කළ යුතු වන ප්‍රදේශ හඳුනාගැනීම සඳහා;

(ඈ) සංරක්ෂිත වනාන්තර කළමනාකරණය සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගැනීම සඳහා සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා; සහ

(ඉ) සංරක්ෂිත වනාන්තර ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා,

අනුගමනය කළ යුතු පිළිවෙත් හෝ නිර්ණායක ද අන්තර්ගත විය යුතු ය.

3. (1) සංරක්ෂක ජනරාල්වරයා විසින් කළමනාකරණ සැලැස්ම අවසන් කරනු ලැබීමෙන් පසු ඊට තම අනුමතය දැක්වීම සඳහා එහි තම අත්සන තැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු වග කිව යුතු ය.

(2) සංරක්ෂිත වනයන්හි තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී සංරක්ෂක ජනරාල්වරයා විසින් කළමනාකරණ සැලැස්මට යම් සංශෝධන සිදු කළ හැකි ය.

(3) අනුමත කරන ලද කළමනාකරණ සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරනු ලබන කටයුතු අධීක්ෂණය කිරීමේ දී සහ එම කටයුතු සම්බන්ධයෙන් එම සැලැස්මේ ඵලදායි බව තක්සේරු කිරීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය, සංරක්ෂක ජනරාල්වරයා විසින්, මාර්ගෝපදේශ ආකාරයෙන් නිශ්චිතව දැක්විය යුතු ය.

4. (1) සංරක්ෂිත වනාන්තරයක විද්‍යාත්මක පර්යේෂණයක් පැවැත්වීමට අදහස් කරන යම් තැනැත්තකු විසින්, පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලුම්කරු විසින්, තම පර්යේෂණයේ කාර්යය සහ විෂය පථය නිශ්චිතව දක්වමින් පර්යේෂණ යෝජනාවක් ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සංරක්ෂක ජනරාල්වරයා විසින්, එම පර්යේෂණ යෝජනාව සලකා බැලීමෙන් පසුව, දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසිවලට යටත් ව එම විද්‍යාත්මක පර්යේෂණය සිදු කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට සහ එම කාර්යය සඳහා වන සතුන් සහ වෘක්ෂලතා නැරඹීමට සංරක්ෂිත වනාන්තරයකට ඇතුළු වීමට අනුමතය ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එකී තැනැත්තා හට, තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීමට නියම කරනු ලැබිය යුතු ය.

(5) අවසර පත්‍රය යටතේ ලබා දී ඇති අධිකාරයේ විෂය පථයෙන් පිටත යම් කාරණයක්, විද්‍යාත්මක පර්යේෂණයක් පැවැත්වීමට අදාළව පැන නගින අවස්ථාවක දී, පර්යේෂණය පවත්වන තැනැත්තා විසින් එවැනි කාරණයක් සම්බන්ධයෙන් සංරක්ෂක ජනරාල්වරයාගේ පූර්ව අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

5. (1) සංරක්ෂිත වනාන්තරයක වනසතුන් සහ වෘක්ෂලතා නැරඹීමට කැමැත්තක් දක්වන යම් තැනැත්තකු විසින්, තත් කාර්ය සඳහා සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, සංරක්ෂක ජනරාල්වරයා විසින්, ඔහු විසින් අවශ්‍ය යැයි සලකන යම් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, අදාළ සංරක්ෂිත වනාන්තරයට ඇතුළු වීමට සහ එහි ඇති වනසතුන් සහ වෘක්ෂලතා නැරඹීමට අනුමතය ලබා දිය හැකි ය.

6. මේ නියෝගවල කාර්යය සඳහා-

"සංරක්ෂක ජනරාල්වරයා" යන්නෙන් (451 වන අධිකාරය වූ) ආඥාපනත යටතේ පත් කරන ලද වන සංරක්ෂක ජනරාල්වරයා අදහස් වේ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අදහස් වේ;

"කළමනාකරණ සැලැස්ම" යන්නෙන් සංරක්ෂිත වනාන්තරවල විද්‍යාත්මක කළමනාකරණය සඳහා ආඥාපනතේ 3අ වන වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද සහ සංරක්ෂක ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සැලැස්මක් අදහස් වේ;

"ආඥාපනත" යන්නෙන්, (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත අදහස් වේ;

පළමුවන උපලේඛනය

(4(1) වන නියෝගය)

*ජාතික වන විද්‍යා පර්යේෂණ කමිටුව*
*පර්යේෂණ ව්‍යාපෘති සඳහා ඉල්ලුම් පත්‍රය*

| | |
|---|---|
| ව්‍යාපෘති අනන්‍යතාව | |
| සංරක්ෂිත වනය | |
| සත්ව/ ශාක/ වෙනත්............................................................ | |

1. ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු

| | |
|---|---|
| 1.1 ව්‍යාපෘතියේ නම | |
| 1.2 අරමුණු | |

1.3 අංශය : ශාක/ සත්ව/ වෙනත් සඳහන් කරන්න ...............................................................................

1.4 ව්‍යාපෘතිය සිදු කරන ස්ථාන

| | *දිස්ත්‍රික්කය* | *වනාන්තරය* | 1.5 විශේෂ කාණ්ඩ | 1.6 විෂය පථය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | සපුෂ්ප ශාක | ජෛව විවිධත්වය |
| 4 | | | ආවෘත නොවන සියලු ශාක | ජෛව ස්කන්ධය/ කාබන් සංරක්ෂණය |
| 5 | | | ක්ෂුද්‍ර ජීවීන් | පරිසර විද්‍යාව |
| 6 | | | ක්ෂීරපායින් | පාරිසරික සංචරණය |
| 7 | | | උභය ජීවීන් | ප්‍රචාරණය |
| 8 | | | උරගයින් | ජෛව වර්ගීකරණය |
| 9 | | | මත්‍ස්‍යයින් | ..................................................... |
| 10 | | | පක්ෂීන් | ..................................................... |
| 11 | | | කෘමීන් | ..................................................... |
| 12 | | | ............................ | ...................................................... |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.7 ව්‍යාපෘතියේ කාලසීමාව | | | සිට | | දක්වා |
| 1.8 දත්ත රැස්කරන කාලසීමාව | | | සිට | | දක්වා |
| 1.9 ව්‍යාපෘතියේ සම්පූර්ණ වටිනාකම ......................................................................................................... | | | | | |
| 1.10 මූල්‍යාධාර සපයන ආයතනය ............................................................................................................... | | | | | |

**2. පෞද්ගලික තොරතුරු**

2.1 ප්‍රධාන විමර්ශක

| | | |
|---|---|---|
| මුලකුරු සමඟ නම | මහාචාර්ය/ ආචාර්ය .................................................. මයා/ මිය | |
| තනතුර | | |
| රාජකාරි ලිපිනය | | කාර්යාලීය දුරකථන අංකය |
| පුද්ගලික ලිපිනය | | නිවසේ දුරකථන අංකය<br><br>ජංගම දුරකථන අංකය |
| ජාතිය | | ජාතික හැඳුනුම්පත් අංකය |
| විද්‍යුත් තපෑල | | |

2.2 පර්යේෂණයට සම්බන්ධවන අනෙකුත් පර්යේෂකයින්

| | *නම* | *තනතුර/ ආයතනය* | *ජා.හැ. අංකය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

2.3 ක්ෂේත්‍ර පර්යේෂණ කාර්ය මණ්ඩලය

| | *නම* | *පුද්ගලික ලිපිනය* | *ජා.හැ. අංකය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

### 3. පර්යේෂණය පිළිබඳ විස්තර

| | |
|---|---|
| 3.1 | ව්‍යාපෘතිය සාධාරණීකරණය කරමින් ක්‍රමවේද/ කාලසීමාව සහ අපේක්ෂිත ප්‍රතිඵල යනාදිය ඇතුළත් කර සකස් කරන ලද ව්‍යාපෘතිය පිළිබඳ සාරාංශය<br>කරුණාකර ව්‍යාපෘති යෝජනාවේ පිටපතක් අමුණන්න |
| 3.2 | මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා අදාළ වෙනත් ආයතනවලින් අවසර ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඔබ එම අවසර ලබාගෙන තිබේද? (කරුණාකර එම අවසර පත්‍රයේ පිටපතක් අමුණන්න) |

### 4. මෙයට පෙර සිදු කරන ලද පර්යේෂණ පිළිබඳ තොරතුරු

පසුගිය වසර දහයක කාල පරිච්ඡේදය තුළ සංරක්ෂිත වනාන්තරයක් තුළ අයඳුම්කරු විසින් (ප්‍රධාන විමර්ශක වශයෙන් හෝ ඊට සම්බන්ධ වෙනත් පර්යේෂකයකු වශයෙන්) සිදුකරන ලද යම් පර්යේෂණයක් තිබේ නම්, කරුණාකර ඒ පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.

| *ව්‍යාපෘතියේ නම (කෙටියෙන්)* | *අවසර ලබාගත් වසර* | *ව්‍යාපෘතියේ ප්‍රධාන විමර්ශක (P I)* | *ව්‍යාපෘති වාර්තාව භාරදී තිබේද (ඔව්/ නැත)* |
|---|---|---|---|
| | | | |

### 5. ආයතන ප්‍රධානියාගේ සහතිකය

| | |
|---|---|
| 5.1 | ප්‍රධාන විමර්ශකගේ සහතිකය<br>.................................................................................................. (සම්පූර්ණ නම) වන මම, මා විසින් ඉහත දක්වා තිබෙන සියලුම විස්තර සත්‍ය සහ නිවැරදි බවට මෙයින් සහතික කරමි. තවද, පර්යේෂණ කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබෙන මාර්ගෝපදේශ සහ කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟවන අතර, වන සංරක්ෂණ ආඥා පනතේ සහ ඒ යටතේ සාදන ලද රීති සහ නියෝගවලට අනුකූලව කටයුතු කරන බවට එකඟ වෙමි.<br><br>නම: මහාචාර්ය/ ආචාර්ය .............................................................................. මයා/ මිය<br><br>තනතුර: ...............................................................<br><br>ආයතනය :...........................................................<br><br>දිනය :.................................................................... ඉල්ලුම්කරුගේ අත්සන |

| | |
|---|---|
| 5.2 | ආයතන ප්‍රධානියාගේ සහතිකය<br><br>මහාචාර්ය/ ආචාර්ය / ................................................................................ මයා/ මිය ගේ ඉල්ලුම්පත්‍රය සඳහා අනුමතය ලබාදෙන අතර අයදුම්කරුට පර්යේෂණය සඳහා ආයතනය සතු පහසුකම් සපයා දෙනු ලබන බව ප්‍රකාශ කරනු ලැබේ.<br><br>නම: මහාචාර්ය/ ආචාර්ය ................................................................................ මයා/ මිය<br><br>දුරකථන අංකය : ........................................................................<br><br>දිනය : ....................................................................<br><br>....................................................................<br>ආයතන ප්‍රධානියාගේ අත්සන හා<br>නිල මුද්‍රාව |

දෙවන උපලේඛනය

[4(3) වන නියෝගය]

***පර්යේෂණයක් සිදු කිරීම සඳහා වන කොන්දේසි***

1. සංරක්ෂිත වනාන්තරයක යම් පර්යේෂණයක් සිදු කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා, පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව සකස් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක්, පර්යේෂණයේ කටයුතු ආරම්භ කිරීමට අවම වශයෙන් මාස තුනකට පෙරාතුව සංරක්ෂක ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. ජාතික වන පර්යේෂණ කමිටුවේ නිර්දේශ මත පදනම්ව සහ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීමෙන් පසු සංරක්ෂක ජනරාල්වරයා හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රය, වසරක උපරිම කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය. අවසර පත්‍රයක වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා, අවසර දී ඇති කාල සීමාව ඉකුත් වීමට අවම වශයෙන් මාසයකට පෙර හේතු ඉදිරිපත් කරමින් පර්යේෂණයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ද සමඟ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා සංරක්ෂිත වනාන්තරයකට ඇතුළු වන යම් තැනැත්තකු වන සංරක්ෂණ ආඥා පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන රීති සහ නියෝගවලට මෙන්ම වෙනත් යම් ලිඛිත නීතියකට යටත් විය යුතු ය.

4. සංරක්ෂිත වනාන්තරයක් තුළ සිදු කරනු ලබන හෝ පවත්වනු ලබන පර්යේෂණයකට අදාළ යම් ක්‍රියාකාරකමක් හෝ අධ්‍යනයක් වන නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබිය යුතු හෝ පවත්වනු ලැබිය යුතු ය.

5. අවසර පත්‍රය පවරනු ලැබිය නොහැකි විය යුතු ය. පර්යේෂකයා විසින් ඔහුගේ පර්යේෂණ ව්‍යාපෘතියේ යම් වෙනසක් සිදු කිරීමට අදහස් කරන අවස්ථාවක දී ඔහු විසින් සංරක්ෂක ජනරාල්වරයාගෙන් ඒ සඳහා පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

6. යම් විදේශීය පර්යේෂකයකු විසින් ඔහුගේ පර්යේෂණ ඉල්ලුම් පත්‍රය ස්වකීය ආයතනයේ ප්‍රධානියා හරහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි පර්යේෂණ ව්‍යාපෘතියක් රාජ්‍ය අනුබද්ධ දේශීය පර්යේෂණ ආයතනයක් හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලැබිය යුතු ය. අදාළ දේශීය පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා විසින් එම පර්යේෂණ ව්‍යාපෘතිය අනුමත කරනු ලැබිය යුතු අතර, එම පර්යේෂණයේ ප්‍රධාන විමර්ශක, අදාළ දේශීය පර්යේෂණ ආයතනයේ අයකු විය යුතු ය.

7. පර්යේෂකයා විසින් අවසර පත්‍රයේ යම් කොන්දේසියක් කඩ කිරීමක් පිළිබඳ අනාවරණය වුවහොත්, එය අවසර පත්‍රය අවලංගු කරනු ලැබීමට හෝ වෙනත් යම් පර්යේෂණයක් සිදු කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරියේ දී කරනු ලබන යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු විය හැකි ය.

8. පර්යේෂණය සිදු කරනු ලබන කාල සීමාව තුළ යම් තැනැත්තකුට හෝ දේපළකට සිදු වන යම් හානියක් හෝ පාඩුවක් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වගකිව යුතු නොවේ.

9. පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු මාස හයක් ඇතුළත පර්යේෂණයේ ප්‍රතිඵල හෝ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රතිඵල පිළිබඳ ඉදිරිපත් කිරීමක් වන සංරක්ෂණ දෙපාර්මේන්තුවේ නිලධරයන්ට ඉදිරිපත් කරන ලෙසට සංරක්ෂක ජනරාල්වරයා විසින් ඉල්ලීමක් සිදු කළ හැකි ය. පර්යේෂණයේ ප්‍රතිඵල ඇතුළත් වන නිබන්ධනයේ, පර්යේෂණ පත්‍රිකාවල සහ සම්මන්ත්‍රණ වාර්තාවල පිටපත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මෙම අවශ්‍යතා ඉදිරි පර්යේෂණ කාර්යයක් සඳහා ඉල්ලීමක් සිදු කිරීමට පෙර සපුරනු ලැබිය යුතු ය.

10. පර්යේෂණ ව්‍යාපෘතියේ ස්වභාවය අනුව වන සංරක්ෂක ජනරාල්වරයා විසින් වෙනත් යම් කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

ඉහත කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට මම/අපි මෙයින් එකඟ වන්නෙමි/වන්නෙමු.

නම: ........................................................................................................
තනතුර:...................................................................................................
ආයතනය:.................................................................................................
දිනය:......................................................................................................

.............................................................
ප්‍රධාන විමර්ශකගේ අත්සන

**තුන්වන උපලේඛනය**

[4(4) වන නියෝගය]

*ගාස්තු*

| | | |
|---|---|---|
| 01. | උපාධි අපේක්ෂකයින් විසින් සිදු කරනු ලබන ගාස්තු | ගාස්තු අයකිරීමක් සිදු නොකරයි |
| 02. | එක් අවුරුදු පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා | රු. 5,000.00 |
| 03. | පර්යේෂණ ව්‍යාපෘතියක් එක් අවුරුද්දකින් දීර්ඝ කිරීම සඳහා | රු. 2,500.00 |
| 04. | පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ආපසු ගෙවන තැන්පත් ගාස්තුව (අංක 01 සඳහා අදාළ නොවේ) | රු. 10,000.00 |

EOG 08 - 0205 /4

එල්.ඩී.ඕ 203/33 (V)

**වන සංරක්ෂණ ආඥාපනත (451 වන අධිකාරය)**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය සහ 64 වන වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා වන්නිආරච්චි,**
වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මෙම නියෝග, 2023 අංක 04 දරන වන සංරක්ෂණ (රක්ෂිත වනාන්තර) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2023.08.21 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) මෙම නියෝගවල විධිවිධාන, සියලුම රක්ෂිත වනාන්තරවලට අදාළ වේ.

2. ආඥාපනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංරක්ෂක ජනරාල් විසින් පිළියෙල කරන ලද කළමනාකරණ සැලැස්මෙහි -

(අ) රක්ෂිත වනාන්තර තුළ ජෛව විවිධත්වය, පස සහ ජලය සංරක්ෂණය සඳහා ද, ඒවායේ අනන්‍ය පරිසර පද්ධතිය, ජාන සම්පත් සහ දුර්ලභ සහ ආවේණික වන සත්ව සහ වෘක්ෂලතා විශේෂවල වාසභූමියක් ලෙස එම වනාන්තර සුරැකීම සඳහා ද ගත යුතු පියවර අඩංගු විය යුතු ය; සහ

(ආ) (i) අවශ්‍ය අවස්ථාවල දී අවශ්‍ය පරිදි රක්ෂිත වනාන්තර මැනීම සහ ඒවායේ මායිම් සලකුණු කිරීම සඳහා;

(ii) රක්ෂිත වනාන්තර කළමනාකරණ කලාපවලට බෙදීම සහ අවශ්‍ය අවස්ථාවල දී එම කලාපවල මායිම් වෙනස් කිරීම සඳහා;

(iii) රක්ෂිත වනයන් කළමනාකරණය සඳහා අවශ්‍යවන සුවිශේෂී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම සඳහා;

(iv) රක්ෂිත වනයන් කළමනාකරණයට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා;

(v) රක්ෂිත වනයන් සුරැකීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දීම සඳහා සහ ක්‍රියාත්මක කිරීම සඳහා; සහ

(vi) රක්ෂිත වනයන්හි වන නිෂ්පාදන තිරසාර අන්දමට පරිභෝජනය කිරීම සඳහා,

අවස්ථාවෝචිත පරිදි, අදාළ පිළිවෙත් සහ උපමාන අඩංගු විය යුතු ය.

3. (1) කළමනාකරණ සැලැස්ම සකස් කර අවසන් වූ පසු සංරක්ෂක ජනරාල් විසින් ස්වකීය අනුමතය පළ කිරීම සඳහා එයට තම අත්සන යොදනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔහු සතු විය යුතු ය.

(2) රක්ෂිත වනයන්හි තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා, අවශ්‍ය අවස්ථාවන්හි දී සංරක්ෂක ජනරාල්වරයා විසින් කළමනාකරණ සැලැස්මට යම් සංශෝධන සිදු කළ හැකි ය.

(3) අනුමත කළමනාකරණ සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් නියාමනය කිරීමේ දී සහ එවැනි ක්‍රියාකාරකම් පිළිබඳව එවැනි සැලැස්මක ඵලදායීතාවය තක්සේරු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, මාර්ගෝපදේශ ආකාරයෙන් සංරක්ෂක ජනරාල් විසින් නිශ්චිතව සඳහන් කළ යුතු ය.

4. (1) රක්ෂිත වනයන්හි තිරසාර කළමනාකරණය තහවුරු කිරීම සඳහා, සංරක්ෂක ජනරාල් විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී ජන කොටස්වල සහ රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය, එම කාර්ය සඳහා කළමනාකරණ ගිවිසුමකට එළඹීමට යටත්ව ලබාගත හැකි ය.

(2) ඉහත නිශ්චිතව දක්වා ඇති පරිදි රක්ෂිත වනයක කළමනාකරණය සඳහා කළමනාකරණ ගිවිසුමකට එළඹීමට අවශ්‍ය වූ අවස්ථාවක දී, සංරක්ෂක ජනරාල් විසින් ගිවිසුම සකස් කරනු ලැබිය යුතු අතර, එම ගිවිසුමේ පාර්ශවකරුවන් වන සියලු කොටස්කරුවන් විසින් එයට අත්සන් තැබිය යුතු ය.

(3) කළමනාකරණ සැලැස්මෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන ඡේදය යටතේ කළමනාකරණ ගිවිසුමක් පවතින්නා වූ ද, එවනි ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමෙන් ජන කොටස්වලට සහ රාජ්‍ය නොවන අංශයට ප්‍රතිලාභ ලැබෙන්නා වූ ද අවස්ථාවල දී, එවැනි වනයකින් ජන කොටස් සහ රාජ්‍ය නොවන අංශය ලබා ගන්නා මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභවල වටිනාකමට සමානුපාතික වටිනාකමක් පිළිබිඹු කෙරෙන ගාස්තුවක් සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කොට අය කර ගනු ලැබිය යුතු ය. ලබා ගන්නා ප්‍රතිලාභ පිළිබඳව අනාවරණය නොකිරීම ආඥාපනත යටතේ වරදක් විය යුතු ය.

5. කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින හෝ ඒ හා සම්බන්ධ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා රක්ෂිත වනාන්තරයක් තුළ යම් ක්‍රියාකාරකමක නිරත වන සෑම තැනැත්තකු විසින් ම, සංරක්ෂක ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

6. (1) සංරක්ෂක ජනරාල් විසින් පහත දේ සඳහා ප්‍රාදේශීය ප්‍රජාව ට අවසර ලබා දිය හැකි ය :-

(අ) ඕනෑම රක්ෂිත වනාන්තරයකින් මැරුණු හා වැටී ඇති කෝටු ඉවත් කිරීම සඳහා:

එසේ වුව ද,

(i) මැරුණු සහ වැටී ඇති කෝටු ගෘහස්ථ ඉන්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා දර වශයෙන් භාවිත කළ හැකි අතර, එම කෝටු දිගින් මීටරයකට නොවැඩිවන පරිදි කැපීමෙන් පසු ඒවා වනාන්තරයෙන් පිටතට රැගෙන යා යුතු ය; සහ

(ii) කිසිදු තැනැත්තෙකු මැරුණු සහ වැටී ඇති කෝටු එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ඉවත් කිරීම හෝ ඇදගෙන යාම නොකළ යුතු අතර කෘමීන්, ක්ෂුද්‍ර ජීවීන් සහ අනෙකුත් සත්ව සහ ශාක විශේෂ සඳහා වාසභූමි සැපයීම සඳහා ප්‍රමාණවත් මැරුණු දැව ප්‍රමාණයක් වන නිලධාරීන් විසින් පෙන්වා දෙන ස්ථානවල ඉතිරි කර තැබිය යුතු ය;

(ආ) ජාන සම්පත්, පරිසර පද්ධති සහ දුර්ලභ මෙන්ම වඳ වී යාමේ තර්ජනයට ලක් වූ සතුන් සහ ශාක යනාදිය සංරක්ෂණයට අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි ඕනෑම රක්ෂිත වනයකින් දැව නොවන වන නිෂ්පාදන එකතු කිරීම හා ඉවත් කිරීම සඳහා;

(ඇ) ජල ප්‍රභවයේ ඉහළ සහ පහළ ප්‍රදේශවල තිබෙන ජලජ වාසභූමිවලට බාධා නොවන පරිදි රක්ෂිත වනාන්තරයක ස්වාභාවික උල්පත්, ජලකර සහ වෙනත් ස්වාභාවික ජල ප්‍රභවයන්ගෙන් පානීය අවශ්‍යතාව සඳහා ජලය ප්‍රයෝජනයට ගැනීම සඳහා.

(2) ඉහත සඳහන් කිසිදු ක්‍රියාකාරකමක්, ඒ කාර්යය සඳහා නිකුත් කරන ලද ලිඛිත අවසරයෙහි දක්වා තිබෙන කොන්දේසිවලට අනුකූලව මිස අන්‍යාකාරයෙන් සිදු නොකළ යුතු ය.

7. (1) රක්ෂිත වනාන්තරයක් තුළ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට අදහස් කරන යම් තැනැත්තෙක්, සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ආකෘතියෙන් යුත් ඉල්ලීමක් සංරක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ඉල්ලීම සලකා බැලීමෙන් පසු සංරක්ෂක ජනරාල් විසින්, උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නියම සහ කොන්දේසිවලට යටත්ව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගය යටතේ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට අනුමතය ලැබූ සෑම තැනැත්තකු ම, සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තුවක් ගෙවීමට නියම කරනු ලැබිය යුතු ය.

(4) විද්‍යාත්මක පරීක්ෂණයක් සිදු කිරීම සම්බන්ධව, අවසර පත්‍රය මගින් ලබා දුන් අධිකාරයේ සීමාවන්ට පරිබාහිරව යම් කාරණයක් පැන නගින අවස්ථාවක දී, එම පර්යේෂණය සිදු කරන තැනැත්තා විසින් ඒ සඳහා සංරක්ෂක ජනරාල්ගේ පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නියෝගවල -

"සංරක්ෂක ජනරාල්" යන්නෙන්, ආඥාපනතේ 58 වන වගන්තිය යටතේ පත් කරන ලද වන සංරක්ෂක ජනරාල් අදහස් වේ;

"දර" යන්නෙන්, ආඥාපනතේ I වන සහ II වන උපලේඛනවල දක්වා ඇති ශාක වර්ගයක් නොවන ඕනෑම ශාක වර්ගයක දිගින් මීටර් 1 ට (අඩි 3) වැඩි නොවන්නා වූ ද, දෙකෙළවර වට ප්‍රමාණය සෙන්ටි මීටර් 45 ට (අඟල් 18) වැඩි නොවන්නා වූ ද, දැව අදහස් වන අතර, උපලේඛනවල දැක්වෙන ශාඛ වර්ගවල ඉහත දැක්වෙන නිශ්චිත ප්‍රමාණවලට අනුකූලවන අතු ද ඇතුළත් වේ;

"ප්‍රදේශීය ප්‍රජාව" යන්නෙන්, අදාළ රක්ෂිත වනාන්තරයේ මායිමේ සිට කිලෝ මීටර් එකක ගුවන් දුර ප්‍රමාණයක් ඇතුළත සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ පිහිටි ග්‍රාම නිලධාරී වසමක ස්ථිර පදිංචිකරුවන් අදහස් වේ;

"කළමනාකරණ සැලැස්ම" යන්නෙන්, යම් වනයක් විද්‍යාත්මක කළමනාකරණය සඳහා ආඥාපනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද සංරක්ෂක ජනරාල් විසින් අනුමත කරන ලද සැලැස්මක් අදහස් වේ;

"දැව නොවන වන නිෂ්පාදන" යන්නෙන්, කොළ, මල්, ගෙඩි, ඇට, පළතුරු, අල, යුෂ, තෙල්, දුම්මල, රෙසින, මැලියම්, තිපල්, ඖෂධ පැළෑටි, එහි කොටස් හෝ ඉන් උපදින ද්‍රව්‍ය, තෘණ, වැල්, බට, පන්, පෙඳ පාසි, උණ, වේවැල්, හතු සහ පැණි අදහස් වේ;

"ආඥාපනත" යන්නෙන්, (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත අදහස් වේ;

"රක්ෂිත වනාන්තර" යන්නෙන්, ආඥා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද වනාන්තර සහ 10 වන වගන්තිය ප්‍රකාරව රක්ෂිත යැයි සලකනු ලබන වනාන්තර අදහස් වේ;

"කෝටු" යන්නෙන්, ඕනෑම ශාඛ වර්ගයක මැද වට සෙන්ටි මීටර 45 කට අඩු වූ ද, මැරුණු හා මැරී වැටී ඇති දැව අදහස් වේ.

උපලේඛනය

[7 (2) වන නියෝගය]

*විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමේ කොන්දේසි.*

1. රක්ෂිත වනයක යම් පර්යේෂණයක් සිදු කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, සංරක්ෂක ජනරාල් විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකට සාරානුකූලව පිළියෙල කර, පර්යේෂණය ආරම්භ කිරීමට නියමිත දිනට අවම වශයෙන් මාස තුනකට පෙර සංරක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

2. ජාතික වන පර්යේෂණ කමිටුවේ නිර්දේශය මත හා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, සංරක්ෂක ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වන නිලධරයකු විසින් නිකුත් කරන අවසර පත්‍රය වසරක උපරිම කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය. අවසර පත්‍රයේ කාලය දීර්ඝ කර ගැනීම සඳහා, අවසර දී ඇති කාලය ඉකුත් වීමට අවම වශයෙන් මාසයකට පෙර ඒ සඳහා හේතු ඉදිරිපත් කරමින් පර්යේෂණයේ ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ද සමග ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

3. පර්යේෂණයක් සිදු කිරීම සඳහා වනයට ඇතුළු වන යම් තැනැත්තකු වන සංරක්ෂණ ආඥාපනතෙහි විධිවිධානවලට සහ ඒ යටතේ සාදා ඇති රීති සහ නියෝගවලට ද, වෙනත් යම් ලිඛිත නීතියකට ද යටත් විය යුතු ය.

4. රක්ෂිත වනාන්තරයක් තුළ සිදුකරනු ලබන විද්‍යාත්මක පර්යේෂණයක් හා සම්බන්ධ යම් ක්‍රියාකාරකමක් හෝ අධ්‍යයනයක් වන නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය.

5. අවසර පත්‍රය අන් අයට පැවරීම සිදු කළ නොහැක. පර්යේෂණ ව්‍යාපෘතියේ යම් සංශෝධනයක් සිදු කිරීමට පර්යේෂකයා අදහස් කරන්නේ නම් ඒ සඳහා සංරක්ෂක ජනරාල්ගේ පූර්ව අනුමතය ලබාගත යුතු ය.

6. යම් විදේශීය පර්යේෂකයෙක් ස්වකීය පර්යේෂණ ඉල්ලුම් පත්‍රය තමා සේවය කරනු ලබන ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, එවැනි පර්යේෂණ ව්‍යාපෘතියක් රාජ්‍ය අනුබද්ධ දේශීය පර්යේෂණ ආයතනයක් හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව සිදු කළ යුතු ය. එම පර්යේෂණ ව්‍යාපෘතිය අදාළ දේශීය පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා විසින් අනුමත කරනු ලැබ තිබිය යුතු අතර, පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන විමර්ශක එම ආයතනයේ තැනැත්තකු විය යුතු ය.

7. පර්යේෂකයා විසින් අවසර පත්‍රයේ සඳහන් යම් කොන්දේසියක් කඩකිරීමක් පිළිබඳව අනාවරණය වුවහොත් අවසර පත්‍රය අවලංගු කිරීමට හෝ වෙනත් පර්යේෂණයක් සඳහා ඉදිරියේ දී කරනු ලබන ඉල්ලීම් නොසලකා හැරීමට සංරක්ෂක ජනරාල් තීරණය කරනු ලැබිය හැකි ය.

8. පර්යේෂණය සිදු කරනු ලබන කාලය තුළ යම් තැනැත්තකුට හෝ දේපළකට සිදුවිය හැකි කිසියම් හානියක් හෝ පාඩුවක් පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වගකියනු නොලැබිය යුතු ය.

9. පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් කර මාස හයක් ඇතුළත අදාළ පර්යේෂණයේ ප්‍රතිඵල හෝ සොයා ගැනීම් ඇතුළත් වාර්තාවක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය වෙත ඉිදිරිපත් කළ යුතු ය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයන් වෙත එම පර්යේෂණයේ සොයා ගැනීම් සහිත ඉදිරිපත් කිරීමක් සිදු කරන ලෙස සංරක්ෂක ජනරාල් විසින් ඉල්ලීමක් සිදු කළ හැකි ය. තව ද එම පර්යේෂණයේ ප්‍රතිඵල ඇතුළත් නිබන්ධන, පර්යේෂණ පත්‍රිකා, සම්මන්ත්‍රණ වාර්තා ආදියෙහි පිටපත් ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු ය. ඉදිරියේ දී පර්යේෂණ සඳහා ඉල්ලීම් සිදු කිරීමට පෙර එම අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

10. පර්යේෂණ ව්‍යාපෘතියේ ස්වභාවය අනුව සංරක්ෂක ජනරාල් විසින් අවස්ථාවෝචිත වෙනත් කොන්දේසි පැනවිය හැකි ය.

මම/අපි ඉහත කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟත්වය පළ කරමි/ පළ කරන්නෙමු.

නම : ........................................................................................................................................................

තනතුර : ........................................................................................................................................................

ආයතනයः ........................................................................................................................................................

දිනය : ........................................................................................................................................................

...................................................................
ප්‍රධාන විමර්ශකගේ අත්සන

EOG 08 - 0205/5

එල්.ඩී.-බී. 203/33 **(VII) (A)**

**(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත**

(451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 58 වන සහ 59 වන වගන්ති සමග කියවිය යුතු 64 වන වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2023 අංක 05 දරන වන සංරක්ෂණ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ නියෝග වන නිලධරයන්ගේ බලතල සහ කාර්ය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

2. මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති නිලධරයන් විසින්, ඔවුන්ගේ අදාළ බලප්‍රදේශ තුළ දී, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වන සංරක්ෂණ ආඥාපනතේ අදාළ වගන්තිය යටතේ පවරා ඇති හෝ ලබා දී ඇති, ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

3. වන සංරක්ෂණ ආඥාපනතේ 58 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව, පහත දැක්වෙන සේවා නියුක්තයන් ඔවුන්ගේ අදාළ බල ප්‍රදේශ තුළ වන නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට මෙයින් බලය දෙනු ලැබේ:-

(අ) ආඥාපනතේ 58 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්, නියෝජ්‍ය කළමනාකරුවන්, ප්‍රාදේශීය කළමනාකරුවන්, නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්, ගබඩා නිලධරයන් හෝ වැඩබිම් නිලධරයන්;

(ආ) ඒ ආඥාපනතේ 58 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, වනජීවී අඩවි ආරක්ෂකවරුන්, වනජීවී අඩවි සහකරුවන් සහ වනජීවී නියාමකවරුන්.

4. කලින් කලට සංශෝධිත පරිදි 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 4 දරන කැළෑ නියෝග, ඒ යටතේ සිදුකළ කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ නියෝගවල -

"වන සංරක්ෂණ ආඥාපනත" යන්නෙන්, (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනත අදහස් වේ;

"වන නිලධරයා" යන්නෙන්, වන සංරක්ෂක ජනරාල්, අතිරේක වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂකවරුන්, නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්, සහකාර වන සංරක්ෂකවරුන්, දිසා වන නිලධරයන්, අතිරේක දිසා වන නිලධරයන්, සහකාර දිසා වන නිලධරයන්, විශේෂ වන පාලකයන්, වන පාලකයන්, අඩවි වන නිලධරයන්, අතිරේක අඩවි වන නිලධරයන්, බීට්ටු වන නිලධරයන්, වන ක්ෂේත්‍ර සහකරුවන්, වගා මුරකරුවන්, වගා කම්කරුවන් හෝ වන කම්කරුවන්ගේ තනතුරට පත් කළ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ වන සංරක්ෂණ ආඥාපනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වන නිලධරයකුගේ යම් කර්තව්‍යක් ඉටු කිරීමට නමින් හෝ ධුරයෙන් පත් කරන ලද වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"රාජ්‍ය දැව සංස්ථාව" යන්නෙන්, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය දැව සංස්ථාව අදහස් වේ.

**උපලේඛනය**

2 වන නියෝගය

| *I වන තීරය බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය* | *II වන තීරය බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න* | *III වන තීරය පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක්* |
|---|---|---|
| 1. වන සංරක්ෂක ජනරාල්වරයා, අතිරේක වන සංරක්ෂක ජනරාල්වරුන් සහ වන සංරක්ෂකවරු | 3(3) | 3(2) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යයන් සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් රක්ෂිත වනයක් සඳහා කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. |
| | 3අ(4) | 3අ(1) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් යම් සංරක්ෂණ වනයක් සම්බන්ධයෙන් කළමනාකරණ සැලසුම් සකස් කරන ලද්දේ ද, එවැනි කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. |
| | 19 | 19 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කටයුතු සඳහා අවසරය ප්‍රදානය කිරීම. |
| | 24(1)(උ) | මුරපොලවල් පිහිටුවීම. |
| | 24(1)(ඌ) | ගෙන යමින් තිබිය දී තහනමට ගනු ලැබූ දැව හෝ වන නිෂ්පාදන ගෙන ආ හැකි මුරපොල-වල් හෝ ස්ථාන නම් කිරීම සහ ඒවා ප්‍රවාහනය පිණිස බලපත්‍ර නිකුත් කිරීම. |
| | 24(1)(එ) | යම් භූමියක් හරහා රජයට අයිති දැව ප්‍රවාහනයට බලය ලබා දීම සහ ඒ දැව ප්‍රවාහනයේ දී හෝ ඉවත් කිරීමේ දී සිදු වන අලාභ සඳහා ගෙවිය යුතු වන්දි නියාමනය කිරීම. |
| 2. වන සංරක්ෂක ජනරාල්වරයා, අතිරේක වන සංරක්ෂක ජනරාල්වරුන්, වන සංරක්ෂකවරුන්, නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්, සහකාර වන සංරක්ෂකවරුන්, දිසා වන නිලධරයන්, අතිරේක දිසා වන නිලධරයන්, විශේෂ වන පාලකයන් සහ සහකාර දිසා වන නිලධරයන්. | 5 | සංරක්ෂණ වනයන්වල හෝ රක්ෂිත වනයන්වල මාර්ග සහ දිය පාරවල් නැවැත්වීම |
| | 24(1)(ඌ) | ගෙන යමින් තිබිය දී තහනමට ගනු ලැබූ දැව හෝ වන නිෂ්පාදන රගෙන ආ හැකි ස්ථාන නම් කිරීම. |
| | 24(1)(එ) | යම් භූමියක් හරහා දැව ප්‍රවාහනයට බලය ලබා දීම සහ ඒ දැව ප්‍රවාහනයේ දී හෝ ඉවත් කිරීමේ දී සිදු වන අලාභ සඳහා ගෙවිය යුතු වන්දි නියාමනය කිරීම. |
| | 24(1)(ඒ) | ජල මාර්ගවල අවහිරතා වැළැක්වීම. |

| I වන තීරය<br>බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය | II වන තීරය<br>බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න | III වන තීරය<br>පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක් |
|---|---|---|
| | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම සහ අවහිරතා ඉවත් කිරීම සඳහා වැය වූ මුදල් අයකර ගැනීම. |
| | 24(1)(ඕ) | ලී ඉරුම් වලවල් හෝ ලී මෝල් පිහිටුවීම සඳහා සහ මුද්‍රා මිටි සන්තකයේ තබා ගැනීම හෝ රැගෙන යාම සඳහා අවසර ලබා දීම. |
| | 30(2) | 30(1) වන වගන්තියේ සඳහන් කළ එක් රැස්කළ දැව රැගෙන ආ යුතු ස්ථාන නම් කිරීම |
| | 31 | 30 වන වගන්තිය යටතේ එක් රැස්කළ දැව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් සිදු කිරීම. |
| | 32 | 30 වන වගන්තිය යටතේ එක් රැස්කළ දැව සම්බන්ධයෙන් වූ හිමිකම් පිළිබඳ පරීක්ෂා කර තීරණ ගැනීම. |
| | 35 | දැව එක් රැස්කිරීම, ඉවත් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම සඳහා වූ වියදම් ලෙස අයවිය යුතු ගෙවීම් ලබා ගැනීම. |
| | 41 | නඩු විභාගයක් අවසානයේ දී දැව හෝ වන නිෂ්පාදනවල සන්තකය ලබා ගැනීම. |
| | 42 | 37 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ දේපළ විකිණීමට විධාන කිරීම හෝ ඇප භාර ගෙන තහනම මුදා හැරීම. |
| | 45 | 37 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ දේපළ මුදා හැරීම සහ චෝදනා ඉල්ලා අස්කර ගැනීම. |
| | 51 | වන වැරදි සමථයට පත් කිරීම සහ වන්දි ලබා ගැනීම. |
| | 59(1)(ඇ) | වන වැරදි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ එවැනි පරීක්ෂණ අතරතුර දී සාක්ෂි ලබාගෙන සටහන් කිරීම. |

| *I වන තීරය* *බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය* | *II වන තීරය* *බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න* | *III වන තීරය* *පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක්* |
|---|---|---|
| | 69 | රජයට මුදල් ගෙවිය යුතු වූ යම් වන නිෂ්පාදන ඇත්නම්, ඒ වන නිෂ්පාදන සන්තකයට ගැනීම, රඳවා ගැනීම සහ විකිණීම. |
| 3. වන පාලකයන්, අඩවි වන නිලධරයන් සහ අතිරේක අඩවි වන නිලධරයන් | 24(1)(උඋ) | ගෙන යමින් තිබිය දී තහනමට ගනු ලැබූ දැව හෝ වන නිෂ්පාදන රැගෙන ආ හැකි ස්ථාන නම් කිරීම. |
| | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම. |
| | 24(1)(ඕ) | මුද්‍රා මිටි රැගෙන යාමට සහ භාවිත කිරීමට අවසර ලබා දීම. |
| | 24(1)(ග) | 24(1)(ග) යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය වන පරිදි පා කර හරින ලද හෝ ගබඩා කරන ලද දැව හෝ වන නිෂ්පාදන රඳවා තබා ගැනීම. |
| | 30(2) | 30(1) වන වගන්තියේ සඳහන් කළ එක් රැස්කළ දැව රැගෙන ආ යුතු ස්ථාන නම් කිරීම. |
| | 41 | නඩු විභාගයක් අවසානයේ දී දේපළවල සන්තකය ලබා ගැනීම. |
| | 45 | තහනමට ගත් දේපළ නිදහස් කිරීම සහ චෝදනා ඉල්ලා අස්කර ගැනීම. |
| | 59(1)(ඇ) | වන වැරදි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ එවැනි පරීක්ෂණ අතරතුර දී සාක්ෂි ලබා ගෙන සටහන් කර ගැනීම. |
| 4. බිට්ටු වන නිලධරයන් සහ වන ක්ෂේත්‍ර සහකරුවන් | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම. |
| | 24(1)(ඕ) | මුද්‍රා මිටි රැගෙන යාම සහ භාවිත කිරීම. |
| | 24(1)(ග) | 24(1)(ග) යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් පා කර හරින ලද හෝ ගබඩා කරන ලද දැව හෝ වන නිෂ්පාදන රඳවා තබා ගැනීම. |
| | 59(1)(ඇ) | වන වැරදි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සහ ඒ පරීක්ෂණ අතරතුර දී සාක්ෂි ලබා ගෙන සටහන් කර ගැනීම. |

| I වන තීරය බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය | II වන තීරය බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න | III වන තීරය පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක් |
|---|---|---|
| 5. වගා මුරකරුවන් සහ වගා කම්කරුවන් | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම. |
| | 24(1)(ග) | 24(1)(ග) යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් පා කර හරින ලද හෝ ගබඩා කරන ලද දැව හෝ වන නිෂ්පාදන රඳවා තබා ගැනීම. |
| 6. රාජ්‍ය දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන්, නියෝජ්‍ය කළමනාකරුවන්, ප්‍රාදේශීය කළමනාකරුවන්, නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්. | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම. |
| | 24(1)(ඕ) | මුද්‍රා මිටි ගෙන යාමට සහ භාවිත කිරීමට අවසර ලබා දීම. |
| | 24(1)(ග) | 24(1)(ග) යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් පා කර හරින ලද හෝ ගබඩා කරන ලද දැව හෝ වන නිෂ්පාදන රඳවා තබා ගැනීම. |
| | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවතා පරීක්ෂාකර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීමට. |
| | 48 | මහේස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම. |
| 7. රාජ්‍ය දැව සංස්ථාවේ ගබඩා නිලධරයන් | 24(1)(ඕ) | මුද්‍රා මිටි රැගෙන යාම සහ භාවිත කිරීම. |
| 8. රාජ්‍ය දැව සංස්ථාවේ වැඩබිම් නිලධරයන් | 24(1)(ඔ) | ජලමාර්ගවල අවහිරතා ඉවත් කිරීම. |
| | 24(1)(ඕ) | මුද්‍රා මිටි රැගෙන යාම සහ භාවිත කිරීම. |
| | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවතා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීම. |

| *I වන තීරය* *බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය* | *II වන තීරය* *බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න* | *III වන තීරය* *පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක්* |
|---|---|---|
| | 48 | මහේස්ත්‍රාත්වරයෙකුගෙන් ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම. |
| 9. දිස්ත්‍රික් ලේකම්වරුන් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් | 24(1)(උඋ) | ගෙන යමින් තිබිය දී තහනමට ගනු ලැබූ දැව හෝ වන නිෂ්පාදන රැගෙන ආ හැකි ස්ථාන නම් කිරීම. |
| | 24(1)(එ) | යම් භූමියක් හරහා රජයට අයත් දැව ප්‍රවාහනයට අවසර දීම. |
| | 24(1)(ඒ) | ජල මාර්ගවල අවහිරතා වැළැක්වීම |
| | 24(1)(ඔ) | ජල මාර්ගවල අවහිරතා ඉවත් කිරීම සහ ඒ සඳහා වැය කළ මුදල් අයකර ගැනීම පිණිස දැව හෝ වන නිෂ්පාදන අලෙවි කිරීම. |
| | 24(1)(ඕ) | මුද්‍රා මිටි රැගෙන යාමට සහ භාවිත කිරීමට අවසර ලබා දීම. |
| | 24(1)(ග) | 24(1)(ග) යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරමින් පා කර හරින ලද හෝ ගබඩා කරන ලද දැව හෝ වන නිෂ්පාදන රඳවා තබා ගැනීම. |
| | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවතා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 28 | පෞද්ගලික දැව ගබඩාවල දැව තොග, ලේඛන සහ දේපළ සලකුණු පරීක්ෂා කිරීම සහ දැව ගබඩාවෙන් සොයා ගත් දැව සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 30(2) | 30(1) වන වගන්තියේ සඳහන් කළ එක් රැස්කළ දැව ගෙන ආ යුතු ස්ථාන නම් කිරීම. |
| | 32 | 30 වන වගන්තිය යටතේ එක් රැස්කළ දැව සම්බන්ධයෙන් වූ හිමිකම් පිළිබඳ පරීක්ෂා කර තීරණ ගැනීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීම. |

| *I වන තීරය* *බලතල පවරන ලද නිලධරයාගේ පන්තිය* | *II වන තීරය* *බලතල පවරන ලද්දේ වන සංරක්ෂණ ආඥාපනතේ කවර වගන්තියක් යටතේ ද යන්න* | *III වන තීරය* *පවරන ලද බලතලවල ස්වභාවය පිළිබඳ ලුහුඬු විස්තරයක්* |
|---|---|---|
| | 48 | මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම |
| 10. දිස්ත්‍රික් ඉඩම් නිලධරයන්, ඉඩම් නිලධරයන්, කච්චේරි මිනින්දෝරුවන්, ග්‍රාම නිලධරයන් සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධරයන් | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවත්වා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීම. |
| | 48 | මහේස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම. |
| 11. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, වනජීවී අඩවි ආරක්ෂකවරුන්, වනජීවී අඩවි සහකරුවන් | 24(1)(උඋ) | ප්‍රවාහනයේ දී තහනමට ගත් දැව හෝ වන නිෂ්පාදන රැගෙන ආ හැකි ස්ථාන නම් කිරීම. |
| | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවත්වා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීම. |
| | 48 | මහේස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම. |
| 12. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනජීවී නියාමකවරුන් | 27 | දැව සහ වන නිෂ්පාදන ගෙන යමින් තිබිය දී නවත්වා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| | 37 | රාජසන්තක කිරීමට යටත් දේපළ තහනමට ගැනීම. |
| | 48 | මහේස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම. |

EOG 08 - 0205/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.